# මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව

# இலங்கை தேசிய மனிதவள அபிவிருத்தி சபை

# NATIONAL HUMAN RESOURCES DEVELOPMENT COUNCIL OF SRI LANKA

## වාර්ෂික වාර්තාව

## ஆண்டு அறிக்கை

## ANNUAL REPORT

## 2015

ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය

**Ministry of National Policies and Economic Affairs**

**தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார விவகாரங்கள் அமைச்சு**


354/2, නිපුණතා පියස, 7 වන මහල, ඇල්විටිගල මාවත, කොළඹ 05

354/2, 7 ஆம் மாடி, நிபுனதா பியச, எல்பிடிய மவாத்தை கொழும்பு - 05

354/2, NIPUNATHA PIYASA, 7TH FLOOR, ELVITIGALA MAWATHA, COLOMBO 05.

## ආයතනික පසුබිම

| | | |
|---|---|---|
| ආයතනය | : | මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව |
| අමාත්‍යාංශය | : | ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය |
| ලිපිනය | : | 354/2, 7වන මහල, නිපුණතා පියස, ඇල්විටිගල මාවත, නාරාහේන්පිට, කොළඹ 05 |
| ඊ මේල් ලිපිනය | : | development.nhrdc@gmail.com |
| වෙබ් අඩවිය | : | www.nhrdc.gov.lk |
| දුරකථන අංකය | : | 0112595680 |
| ෆැක්ස් | : | 0112595680 |
| බැංකු කරුවන් | : | ලංකා බැංකුව<br>මහජන බැංකුව |

## සභාපතිතුමාගේ ප්‍රකාශය

1997 අංක 18 දරණ මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභා පනතින් මෙම සභාව කෙටි කාලයක් තුල අමාත්‍යාංශ රැසකට අනුබද්ධවී කටයුතු කර ඇති අතර 2015 වර්ෂය වනවිට ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය යටතේ සිය කටයුතු පවත්වා ගෙන යනු ලබයි.

2015 වර්ෂය වන විට සියළුම කාර්ය මණ්ඩල බඳවා ගැනීම් සිදු කර මෙම ආයතනය සංස්ථාපනය කරන ලද පනතින් අපේක්ෂිත කාර්ය භාරය අනුව පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘතින් සංවිධානය කරන ලද අතර ඉදිරි පර්යේෂණයන් සඳහා එසේ සැළසුම්කල ව්‍යාපෘති ඇසුරෙන් සංයුක්ත සැළැස්මක් සකස් කර එහි අන්තර්ගත දැක්ම සාක්ෂාත් කරගැනීම සඳහාත් හඳුනාගත් මෙහෙවර ඉටුකිරිම සඳහාත් මහා භාණ්ඩාගාරයෙන් ප්‍රාග්ධන වියදම් ලෙස වෙන් කෙරුණ රුපියල් මිලියන 20 ක මූල්‍ය සීමාව යටතේ 2015 ක්‍රියාත්මක සැළැස්ම සකස්කර ඇත.

මෙම සැළැස්මේ ව්‍යාපෘතීන් තෝරා ගැනීමේදී අදාල පනතේ 14.1 වගන්තියෙන් දක්වා ඇති ප්‍රධාන ක්ෂේත්‍රයන් අනාවරණය වන පරිදි ව්‍යාපෘතීන් හඳුනා ගෙන ඇති අතර එම ප්‍රධාන ක්ෂේත්‍රයන් වනුයේ

(a) රැකීරක්ෂා, පුහුණුව සහ අධ්‍යාපනය

(b) විද්‍යාව සහ තාක්ෂණය උපයෝගී කර ගැනීම

(c) ජීවන තත්වය නංවාලීම

(d) අවාසිකර තැනැත්තන්ගේ කණ්ඩායම් සඳහා සමාජ ආරක්ෂාව සැලසුම් කිරීම

(e) ආර්ථික ප්‍රතිසංස්කරණ මගින් හිමිකම් රැකදීම සම්බන්ධයෙන් වන හෝ අදාළ වන මානව සම්පත් බණ්ඩ පරිමේය කිරීම සහ සමෝධානය කිරීම වේ.

2015 වර්ෂය තුළදී, ''අනාගතය සඳහා සූදානම් ශ්‍රම බලකායක්'' යන දැක්ම සහිත මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව ශ්‍රී ලංකාවේ මානව සම්පත සංවර්ධනය කිරීම වෙනුවෙන් කාර්යක්ෂම සහ සඵලදායී සේවාවක් සැපයීම උදෙසා පහත වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කර ඇත.

## 2015 වර්ෂයේ ක්‍රියාත්මක කළ ව්‍යාපෘති -

**දින 100 වැඩසටහන**

නව රජය මගින් ක්‍රියාවට නංවන ලද දින 100 වැඩසටහනෙහි අඩංගු පහත සඳහන් අංක 31, 55 හා 58 යටතේ දක්වා ඇති කර්තව්‍යයන් ඉටු කර ගැනීම සඳහා මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව මගින් ප්‍රවීන විද්වතුන්ගෙන් සමන්විත කමිටු හරහා ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට අවශ්‍ය නිර්දේශ සපයා ඇත.

31. අපේ තරුණ පරපුරේ අසහනයට මුල් වී ඇති විරැකියාව සහමුලින්ම තුරන් කිරීම ඉලක්ක කරගත් දේශීය හා විදේශීය රැකියා හා ස්වයං රැකියා දස ලක්ෂයක් සැපයීමේ වැඩසටහන ආරම්භ කිරීම.
55. අධ්‍යාපනය සඳහා ලබා දෙන ප්‍රතිපාදන ද.දේ.නි 1.5% සිට 6% දක්වා අවුරුදු 5ක් තුල වැඩි කිරීම.
58. උසස් පෙළ විෂයයන් තුනක් සමත් සියළු දෙනාට උසස් ඩිප්ලෝමාවක් හෝ උපාධියක් දක්වා ඉගෙන ගැනීමට අවශ්‍ය අවකාශ සම්පාදනය කිරීම.

නව රජය මගින් ක්‍රියාවට නංවන ලද දින 100 වැඩසටහනෙහි අංක **58 යටතේ උසස් පෙළ විෂයන් තුනක් සමත් සියළු දෙනාට උසස් ඩිප්ලෝමාවක් හෝ උපාධියක්** දක්වා ඉගෙන ගැනීමට අවශ්‍ය අවකාශ සැලසීම යටතේ පැවැත්වූ වැඩමුළු හරහා පහත යෝජනා ඉදිරිපත් කර ඇත.

1. දේශීය විශ්වවිද්‍යාල සඳහා සුදුසුකම් ලැබුවන් අතරින් බඳවාගන්නා ප්‍රමාණය වැඩි කිරීම
2. සුදුසුකම් ලැබුවන් සඳහා රාජ්‍ය ආයතනවල තෘතියික අධ්‍යාපනය හැදැරීමට පවතින ප්‍රවේශයන් පුළුල් කිරීම
3. තෘතීයික අධ්‍යාපනය ලබාදෙන පෞද්ගලික ආයතන ඒකාබද්ධ කිරීම

**අංක 55 යටතේ අධ්‍යාපනය සඳහා ලබා දෙන ප්‍රතිපාදන ද.දේ.නි 1.5% සිට 6% දක්වා අවුරුදු 5ක් තුල වැඩි කිරීම යන තේමාව යටතේ පැවැත්වූ සාකච්ඡා හරහා කමිටුව ලබාදුන් නිර්දේශ -**

මහාචාර්ය මාරි පෙරේරා, මහාචාර්ය ලක්ෂ්මන් ජයතිලක, මහාචාර්ය මලික් රණසිංහ හා මහාචාර්ය පී.එස්.එම්. ගුණරත්න යන අයගේ මූලිකත්වය යටතේ පිළිවෙළින් ප්‍රාථමික, ද්විතීයික, තෘතීයික, වෘත්තීය අධ්‍යාපන හා උසස් අධ්‍යාපන යන අංශ සඳහා ක්ෂේත්‍රයන්හි ප්‍රවීනයන්ගෙන් සමන්විත කමිටු හරහා කණ්ඩායම් සාකච්ඡා පවත්වා අධ්‍යාපනය සඳහා දළ දේශීය නිශ්පාදිතයෙන් 1.5% සිට 6% දක්වා කෙසේ වැඩි කලයුතුද යන්න සඳහා පහත නිර්දේශ ඉදිරිපත් කරන ලදි.

1. ප්‍රාථමික අධ්‍යාපනය, අධ්‍යාපන අමාත්‍යාංශයේ පාලනයට නතු කිරීම සහ අදාල යටිතල පහසුකම් සැලසීම
2. විශේෂ අවශ්‍යතා ඇති එනම් මානසික සමාජීය ගැටළු වලින් හා අබාධිත තත්වයේ පසුවන සිසුන් පිළිබඳ වැඩි අවධානයක් යොමු කිරීම
3. උ.පෙළ විද්‍යා විෂය ධාරාව උගන්වන පාසැල් 900 සිට 1500 දක්වා වැඩි කිරීම සහ තාක්ෂණ විෂය ධාරාව උගන්වන පාසැල් 250 සිට 1000 දක්වා වැඩි කිරීම

4. ඉංග්‍රීසි, ගණිතය සහ විද්‍යා විෂයයන් උගන්වන ගුරුවරුන්හට ඔවුන්ගේ හැකියාව හා දක්ෂතාව මත දිරි දීමනාවක් ලබාදීම
5. අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාල පර්යේෂණ වැඩිපුර සිදු කිරීම සඳහා ඒ වෙනුවෙන් ජාතික අධ්‍යාපන ආයතනයට ලබාදෙන වාර්ෂික ප්‍රතිපාදන ප්‍රමාණය වැඩි කිරීම
6. උසස් අධ්‍යාපනය ලැබීමට සුදුසුකම් ලැබූ සිසුන්හට තෘතීයික, වෘත්තීය හා වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රයන්හි ඔවුන්ගේ කැමැත්ත පරිදි කැමති අංශයකින් අධ්‍යාපනය හැදෑරීම සඳහා වැයවන වියදම් ආවරණය කර ගැනීම සඳහා වවුචර් ක්‍රමය මගින් අවකාශ සැලසීම
7. පෞද්ගලික විශ්ව විද්‍යාල වලට සමගාමීව උසස්පෙළින් පසු අවම වශයෙන් මාස 6කට පසුවවත් රාජ්‍ය විශ්ව විද්‍යාල වලට ඇතුළත් කර ගැනීම කඩිනම් කිරීම
8. උසස් අධ්‍යාපනය සඳහා බඳවා ගන්නා ප්‍රමාණය 17% සිට 25% දක්වා වැඩි කිරීම
9. පශ්චාත් උපාධි ලබාගැනීම සඳහා රාජ්‍ය අනුග්‍රහය ලබාදීම, ජාත්‍යන්තර රැකියා හා සමුළු සඳහා සහභාගි වීම තුළින් විශ්ව විද්‍යාල කාර්ය මණ්ඩලය සවිබල ගැන්වීම
10. දේශීය විශ්ව විද්‍යාල මගින් සිදුකරනු ලබන පර්යේෂන වල ගුණාත්මකභාවය ඉහල නැංවීම සඳහා මාස 3-6 කාල පරිච්ඡේදයකට ඉහළ පෙළේ ජාත්‍යන්තර විද්වතුන්ගේ සේවය ලබා ගැනීමට ඉඩ සැලසීම
11. ජාත්‍යන්තර ප්‍රතීතනය හා විදේශීය බාහිර පරීක්ෂකවරුන් මගින් උසස් අධ්‍යාපනයේ තත්ව ප්‍රමිතිය සහතික කරවා ගැනීම

**31. අපේ තරුණ පරපුරේ අසහනයට මුල් වී ඇති විරැකියාව සහමුලින්ම තුරන් කිරීම ඉලක්ක කරගත් දේශිය හා විදේශීය රැකිය හා ස්වයං රැකියා දස ලක්ෂයක් සැපයීමේ වැඩසටහන ආරම්භ කිරීම යන තේමාව යටතේ පැවැත්වූ සාකච්ඡා හරහා කමිටුව ලබාදුන් නිර්දේශ -**

මීළග අවුරුදු පහ තුළ පහත සඳහන් ආර්ථික අංශ අටක දේශිය රැකියා ප්‍රක්ශේපිත ඉල්ලුම මිලියන 10 ක් පමණ වන බවත් සඳහන් කර ඇත.

1. කෘෂිකර්ම, ධීවර හා වන වගා
2. නිශ්පාදන අංශය
3. ඉදිකිරීම්, කැනීම්, විදුලිය, ගෑස් සහ ජල සම්පාදන
4. තොග වෙළඳාම් හා සිල්ලර වෙළඳාම්, මෝටර් රථවාහන, භාණ්ඩ
5. හෝටල් හා සංචාරක
6. ප්‍රවාහන, ගබඩා හා සන්නිවේදන
7. මූල්‍ය. වතු, හා ව්‍යාපාර
8. වෙනත්

වර්තමාන ප්‍රක්ශේපිත රැකියා ද.දේ.නි. හා ඵලදායිතාව මත පදනම් වී ඇති අතර කමිටුව පහත නිර්දේශයන් ඉදිරිපත් කරන ලදි.

- ❖ අනු අංශ අනුව ප්‍රක්ශේපිත රැකියා වර්ධනය
- ❖ මෙම රැකියා ලබා දීම සඳහා අදාල සැලසුම් සකස් කිරීම
- ❖ විදේශීය රැකියා සඳහා රාජ්‍ය මැදිහත්වීම

9. කෘෂිකර්ම, නිෂ්පාදන, ඉදිකිරීම්, හෝටල්/සංචාරක, ප්‍රවාහන/ගබඩා/සංනිවේදන, මූල්‍ය සහ වෙනත් යන අංශයන්හි ඵලදායිතාව වැඩිවෙමින් පවති. කෙසේ වෙතත් හෝටල්/සංචාරක සහ ඉදිකිරීම් අංශයන්හි ද.දේ.නි වැඩි ප්‍රතිශතයක් දායක වේ.

මේ යටතේ අප ආයතනය මගින් **"රැකියා අරුණ" වෘත්තීය අභිප්‍රේරණ වැඩසටහන** පොළොන්නරුව හා ගම්පහ යන දිස්ත්‍රික්කයන්හිදී පහත පරිදි පවත්වන ලදී.
මෙම ව්‍යාපෘතියේ අරමුණ වී ඇත්තේ රාජ්‍ය අංශයේ පවතින යටිතල පහසුකම් උපයෝගී කරගනිමින් පාසැල් හැරගිය සිසුන්ගේ වෘත්තීය පුහුණු අවශ්‍යතා ඉටු කරලීම සඳහා අවශ්‍ය සැලසුම් හා මැදිහත් වීම සිදු කිරීම, වෘත්තීය පුහුණු අවස්ථා සහ රැකියා අවස්ථා පිළිබඳ රැකියා අපේක්ෂකයින්ගේ තොරතුරු පරතරය අවම කිරීමයි. රැකියා අපේක්ෂිත දරු දැරියන් 1500 මෙම වැඩසටහන සඳහා සහභාගි වී ඇති අතර ජාතික වාණිජ මණ්ඩලයේ සම්බන්ධීකරණය මගින් සිසුන් 1000කට පමණ පෞද්ගලික අංශයේ රැකියා සඳහා එම ආයතන මගින් බඳවා ගැනීම් සිදු කර ඇත.

**කාර්යක්ෂම, සඵලදායි හා ගුණාත්මක බවින් යුතු රාජ්‍ය සේවයක් සඳහා මානව සම්පත් උපායගීලි ක්‍රම සංවර්ධන කිරීම**

රාජ්‍ය හා අර්ධ රාජ්‍ය අංශවල රැකියාවන් සඳහා නිවැරදි පුද්ගලයා තෝරා ගැනීමටත් එම සේවකයින් උසස් කිරීම් සිදු කිරීමටත් නිවැරදි ක්‍රමවේදයක් සකස් වී නොමැත. එබැවින් සේවකයින්ගෙන් කාර්යක්ෂමතාව, සඵලදායිතාව හා ගුණාත්මක බවින් යුතු සේවයක් ලබා ගැනීම අරමුණු කර ගනිමින් අප සභාව රාජ්‍ය අංශය සඳහා පොදුවේ පිළිගත හැකි රාමුවක්(Competancy Framework) විද්වත් මඩුල්ලකගේ සහයෝගයෙන් පිළියෙළ කර ඇත.

**සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යවසායකයින් සවිබල ගැන්වීම**

සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යාවසායකයින් සවිබල ගැන්වීමේ අරමුණින් ඔවුන් පුහුණු කිරීමේ වැඩමුළු පොළොන්නරුව, මාතර, මහනුවර යන දිස්ත්‍රික්කයන්හි පවත්වා ඇත. මෙහි ප්‍රධාන අරමුණ වී ඇත්තේ සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යාවසායකත්වය පිළිබඳ ඔවුන්ගේ දැනුම එනම් පරිපාලන, මූල්‍ය කළමනාකරණ, වෙළඳ පොළ හඳුනා ගැනීම, කළමනාකරණ ගැටළු හා උපක්‍රම සහ රාජ්‍ය ප්‍රතිපත්ති(බදු, විගණන හා ලියාපදිංචි කිරීම) වැඩි දියුණු කිරීමයි.

**සත්කාරක සේවා හා සංචාරක කර්මාන්තයේ පවතින නිපුණතා හිඩැස අධ්‍යයනය කිරීම**

මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ අනාගතය සඳහා සූදානම් ශ්‍රම බලකායක් යන දැක්ම යටතේ සංචාරක ක්ෂේත්‍රයේ සහ සත්කාරක සේවා හා සම්බන්ධ මානව ප්‍රාග්ධනය සවිබල ගැන්වීම සහ පවතින නිපුණතා පරතරය ආවරණය කිරීම අරමුණු කරගනිමින් අධ්‍යයනය සිදු කරන ලදී. මේ සඳහා මෙම ක්ෂේත්‍රයේ ප්‍රවීනයන්ගෙන් සමන්විත කමිටු 2ක් පත් කර සාකච්ඡා පවත්වා මෙම අධ්‍යයනය සංචාරක කර්මාන්තයේ නියැලෙන පුද්ගලයන් හා විශ්ව විද්‍යාලවල ප්‍රවීනයන් සමග ඒකාබද්ධව සිදු කරන ලදී.

අධ්‍යයන වාර්තාවට අනුව සංචාරක කර්මාන්තය දියුණු කිරිමට අවශ්‍ය දැනුවත් කිරීමේ වැඩසටහන් දිවයින පුරා පැවැත්වීමට අවශ්‍ය පහසුකම් සැලසීමට පියවර ගෙන ඇති අතර සංචාරක කර්මාන්තයේ නියැලෙන්නන් හා පුහුණු ආයතන සම්බන්ධිකරණය කිරීම හා පහසුකම් සැලසීම සිදු කරනු ඇත.

මහාචාර්ය චන්ද්‍රා ඇඹුල්දෙනිය මහතා විසින් පිළියෙළ කරන ලද ඉදිරි වර්ෂ 2016-2020 දක්වා සංචාරක කර්මාන්තය පිළිබඳ පුරෝකථනය කරන ලද “Tourism Industry Forcasts 2016-2020” වාර්තාව ගරු අගමැති රනිල් වික්‍රමසිංහ මැතිතුමා වෙතත්, සංචාරක හා ක්‍රිස්තියානි ආගමික කටයුතු ඇමති ගරු ජොන් අමරතුංග මැතිතුමා වෙතත් පිළි ගන්වන ලදී.

**මාතර දිස්ත්‍රික්කයේ සංවර්ධන අවශ්‍යතා හඳුනා ගැනීම**

ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය යටතේ පවතින ආයතනයක් වශයෙන් මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව 2014- 2015 වර්ෂවල මාතර දිස්ත්‍රික්කයේ සංවර්ධන අවශ්‍යතා හඳුනා ගැනීම සම්බන්ධ අධ්‍යයනයක් සිදුකර ඇත. විශේෂයෙන්ම මෙම අධ්‍යයනය තුළින් පසුගිය කාලවකවානුව තුළ ක්‍රියාත්මක වූ සංවර්ධන ව්‍යාපෘති වලින් ප්‍රදේශයේ ජනතාවට සිදු වූ බලපෑම් සොයා ගැනිමත්, ප්‍රදේශයේ සිදුවන සමාජ විරෝධී ක්‍රියාවල ප්‍රවණතාවය හඳුනා ගැනීමත්, මෙම ප්‍රදේශයේ ජීවත් වන ජනතාවගේ මූලා පහසුකම් සහ ඉතිරි කිරීම් සම්බන්ධ පුරුදු අධ්‍යයනය කිරීමත්, ප්‍රදේශයේ පවතින පාරිසරික ගැටළු හේතුවෙන් මිනිස් ජීවිත වලට සිදුවන බලපෑම් කවරේද යන්නත් හඳුනා ගැනීමත් ප්‍රධාන වශයෙන් මෙම අධ්‍යයනය තුළින් අපේක්ෂා කර ඇත.

අප සභාවට පැවරී ඇති ප්‍රධාන කාර්යය පර්යේෂණ හා අධ්‍යයනයන් සිදු කරමින් ඒ තුළින් අදාළ නිර්දේශ ලබාදීමයි. මෙම අධ්‍යයනය තුළින් දැනට ක්‍රියාත්මක වන සංවර්ධන වැඩසටහන්වල ඵලදායිතාවය වැඩිකර ගැනීමටත් ඒවායේ පවතින දුර්වලතා හඳුනා ගැනීමටත් එම දුර්වලතා අවම කර ගැනිමටත් මෙබඳු අධ්‍යයන පිටුවහලක් වන අතර අනාගත සංවර්ධන කටයුතු සම්බන්ධ ප්‍රතිපත්ති සම්පාදනය කිරීමට දායක කර ගත හැකි වනු ඇත.

**වෘත්තීය පුහුණුව සහ රැකියා ගත වීම සම්බන්ධ ඡායා අධ්‍යයනය -මාතර දිස්ත්‍රික්කය**

මාතර දිස්ත්‍රික්කයේ රාජ්‍ය අනුග්‍රහය ලත් පුහුණු ආයතන වලින් පුහුණුව ලැබුවන් ඉලක්ක කර ගනිමින් ඡායා අධ්‍යයනයක්  සිදු කළ අතර වෘත්තීය පුහුණු ආයතන වලින් වසර තුනකට ප්‍රථම වෘත්තීය පුහුණුව ලැබුවන් වසර තුනකින් පසු කොතරම් සාර්ථකත්වයක් අත් කරගෙන ඇත්ත යන්න පිළිබඳවත් එසේම එම ආයතනවල පුහුණු ක්‍රියාවලිය, එයට සම්බන්ධ අනෙකුත් ක්‍රියාවලින් පිළිබඳව මෙම පර්යේෂණය හරහා අධ්‍යයනය කර ඇත. මෙහි සඳහන් යෝජනා ක්‍රියාත්මක කිරීම තුළින් වෘත්තිය පාඨමාලාවන්වල ගුණාත්මක බව තවත් වර්ධනය කිරීමට හැකිවනු ඇත. එය ගුණාත්මක බවින් යුතු වෘත්තිය අධ්‍යාපනයක් ලත් ශ්‍රම බලකායක් නිර්මාණයවීම කෙරෙහි ඉමහත් පිටිවහලක්වනු ඇත.

තවද, මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව ශ්‍රී ලංකාවේ මානව සම්පත සංවර්ධනය කිරීම වෙනුවෙන් කාර්යක්ෂම සහ කාර්ය සඵල බවින් යුතු සේවාවක් ඉටු කිරීම වෙනුවෙන් ISO 9001:2008 ජාත්‍යන්තර ප්‍රමිති සහතිකයට අනුකූලව කටයුතු කරන ආයතනයක් වශයෙන් පිදුම් ලබා ඇත.

දිනේෂ් වීරක්කොඩි
සභාපති

# පටුන

1.ආයතනික පසුබිම හා විෂය පථය ........................................................................................ 1

2. මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ සංවිධාන ව්‍යුහය ........................................ 4

3. මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ සංවිධාන ව්‍යුහය ........................................ 6

4.මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ සේවය කරන ලද සේවක ලැයිස්තුව හා ඔවුන්ගේ තනතුරු ........................................................................................ 7

5.වැඩසටහන් හා ව්‍යාපෘති ........................................................................................ 9

5.1 දින 100 වැඩසටහන ........................................................................................ 9

5.2 "රැකියා අරුණ" වෘත්තීය අභිප්‍රේරණ වැඩසටහන ........................................................................ 12

5.3 මාතර දිස්ත්‍රික්කයේ සංවර්ධන අවශ්‍යතා හඳුනා ගැනීම ........................................................ 13

5.4 වෘත්තීය පුහුණුව සහ රැකියා ගත වීම සම්බන්ධ ජායා අධ්‍යයනය -මාතර දිස්ත්‍රික්කය .......................... 15

5.5 ඵලදායී, කාර්යක්ෂම සහ ගුණාත්මක රාජ්‍ය සේවාවක් ගොඩ නැංවීම සඳහා මානව සම්පත් ක්‍රමවේදයක් සංවර්ධනය කිරීම ........................................................................................ 19

5.6 සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් ශක්තිමත් කිරීම සහ ප්‍රවර්ධනය කිරීම .................................. 21

5.7 සංචාරක කර්මාන්තයේ සහ සත්කාරක සේවාවන්හි පවතින නිපුණතා හිදැස අධ්‍යයනය කිරීම .......... 23

5.8 මානව සම්පත් සංවර්ධන සභාව තුළ ඵලදායිතාව හා තත්ත්වය ඉහළ නැංවීම. ................................ 24

6. 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය ........................................................ 25

7. මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය ........................................................................................ 27

8. 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා ශුද්ධ වත්කම්/සම කොටස් වල වෙනස්කම් පිළිබඳ ප්‍රකාශනය ........................................................................................ 28

9.මුදල් ප්‍රවාහ ප්‍රකාශය ........................................................................................ 29

10.සටහන් ........................................................................................ 31

11.වැදගත් ගිණුම්කරන ප්‍රතිපත්තීන් සහ අනිකුත් පැහැදිලි කිරීම් වල සාරාංශයකින් සමන්විත සටහන් ..... 41

12. 2015 වර්ෂයට අදාල විගණකාධිපති වාර්තාව ........................................................................ 45

2015 වර්ෂයට අදාල විගණකාධිපති වාර්තාවේ පිළිතුරු ................................................................ 52

# 1.ආයතනික පසුබිම හා විෂය පථය

මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව මානව සම්පත් සංවර්ධනය පිළිබඳ වැදගත් කාර්ය භාරයක් ඉටුකිරීමට 1997 අංක 18 දරණ මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභා පනතින් ස්ථාපිත කරන ලද ආයතනයකි. එම ආයතනයට ලබාදී ඇති බලතල යටතේ මානව සම්පත් සංවර්ධනය සම්බන්ධව සියළු කටයුතු වලදී ප්‍රමුඛතාවය දීමටත් මානව සම්පත් සංවර්ධනය වෙනුවෙන් ප්‍රතිපත්ති උපනයනය කිරීමටත් ප්‍රවර්ධනය කිරීමටත් ක්‍රියාත්මක කිරීමට සහාය ලබා දීමත් යනාදී වැදගත් කාර්යභාරයනට වගකීම දරයි. එහි මූලික අරමුණ වනුයේ අදාල අමාත්‍යවරයාටත්, රජයටත් මානව සම්පත් සංවර්ධනය සම්බන්ධයෙන් නිර්දේශ ලබා දෙන උසස් මට්ටමේ ආයතනයක් ලෙස සංවිධානය වීමයි.

## 1.1ආයතනික හැඳින්වීම

ජාතික මට්ටමේ උපදේශක මණ්ඩලයක් වශයෙන් 1987 ජුනි මස 05 වන දින මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව ආරම්භ වූයේ යෞවන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ඒකකයක් වශයෙනි. ඉන් ඉක්බිතිව 1997 අංක 18 දරණ මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභා පනත මඟින් ස්වාධීන ව්‍යවස්ථාපිත මණ්ඩලයක් ලෙස විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය යටතේ ස්ථාපනය කරන ලදී. එතැන් සිට කෙටි කාලයක් තුලදී, එනම් 2000 වර්ෂයේදී මෙම ආයතනය කාර්මික අධ්‍යාපන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය යටතට පැවරෙන අතර, 2001 දී මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය යටතට පවරනු ලැබීය. ඉන් පසු නැවත රජය වෙනස් වීමෙන් පසුව මෙම ආයතනය නිපුණතා සංවර්ධන, වෘත්තීය හා කාර්මික පුහුණු අමාත්‍යාංශයටත් ඉන්පසු යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයේ පාලනයට නතු කරනු ලැබීය. මෙසේ කෙටි කාලයක් තුල අමාත්‍යාංශ රැසකට අනුබද්ධවී කටයුතු කල මෙම ආයතනය වර්තමානයේදී **ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය** යටතේ සිය කටයුතු පවත්වා ගෙන යනු ලබයි.

## 1.2 දර්ශනය

"අනාගතය සඳහා සූදානම් ශ්‍රම බලකායක්"

## 1.3 මෙහෙවර

රටෙහි මානව සම්පත් සංවර්ධනය උදෙසා ඵලදායි ප්‍රතිපත්ති හා නව්‍යකරණ උපායමාර්ග සංවර්ධනය කිරීම, ක්‍රියාත්මක කිරිම, ප්‍රවර්ධනය කිරීම හා පහසුකම් සැලසීම

**1.4 අරමුණ**

මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ අරමුණ වනුයේ රජයට මානව සම්පත් සංවර්ධනය සම්බන්ධයෙන් උපදෙස් සහ මාර්ගෝපදේශකත්වය දීමට සුදුසු ආයතනික රාමුවක් බිහිකිරීමයි. මානව සම්පත් සංවර්ධන ප්‍රතිපත්ති ක්‍රියාවලි සැලසුම, ප්‍රතිපත්ති සමාලෝචනය හා මානව සම්පත් අංශ වර්ධනය කිරීමත් යනාදී අංශ සඳහා මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව වගකීම් දරයි. සභා පනතට අනුව සභාවේ කාර්ය සහ කර්තව්‍ය පහත සඳහන් පරිදි වේ.

1. (අ) රැකිරක්ෂා, පුහුණුව හා අධ්‍යාපනය
   (ආ) විද්‍යාව හා තාක්ෂණය උපයෝගී කර ගැනීම
   (ඇ) ජීවන තත්වය නංවාලීම
   (ඈ) අවාසිකර තැනැත්තන්ගේ කණ්ඩායම් සඳහා සමාජ ආරක්ෂාව සැලසුම් කිරීම සහ
   (ඉ) ආර්ථික ප්‍රතිසංස්කරණ මගින් හිමිකම් රැකදීම සම්බන්ධයෙන් වන හෝ අදාළ වන මානව සම්පත් බණ්ඩ පරිමේය කිරීම සහ සමෝධානය කිරීම ඇතුළුව, ජාතික මානව සම්පත් ප්‍රතිපත්තියේ සියලු අංශ වලින් අමාත්‍යවරයාට උපදෙස් දීම
2. ජාතික ප්‍රතිපත්තියට අනුකූල වූ මානව සම්පත් සංවර්ධනය කිරීමේ සැලසුම් හා වැඩසටහන් රජයට ඉදිරිපත් කිරීම සඳහා විෂයභාර අමාත්‍යවරයාට නිර්දේශ කිරීම.
3. ජාතික මානව සම්පත් සංවර්ධන ප්‍රතිපත්තිය සහ ක්‍රියාත්මකව පවත්නා සැලසුම් සහ වැඩසටහන් කලින් කල සමාලෝචනය කිරීම හා පරික්ෂා කර බැලීම සහ අවශ්‍ය වන විටක, ඒ ප්‍රතිපත්තියට සැලසුම්වලට හා වැඩසටහන්වලට කළයුතු වෙනස් කිරීම් අමාත්‍යවරයාට නිර්දේශ කිරීම.
4. ආණ්ඩුව විසින් අනුමත කරන ලද මානව සම්පත් සංවර්ධන සැලසුම් සහ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම ගැන සොයා බැලීම
5. මේ පනතේ උපලේඛනයේ සඳහන් කවර හෝ විෂයයන් හා සම්බන්ධ යම් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම. එසේ වුවද එම ව්‍යාපෘතිය වෙනත් යම් අමාත්‍යවරයෙකුට පවරා තිබෙන විෂයයන් හා සම්බන්ධ වන අවස්ථාවක, එය ක්‍රියාත්මක කිරීම, ඒ වෙනත් අමාත්‍යාවරයාගේ එකඟත්වය ඇතිව විය යුතුය සහ
6. ජාතික අරමුණුවලට අනුකූලව මානව සම්පත් සංවර්ධනය කිරීමට අවශ්‍ය යයි හෝ හිතකර යයි හෝ ආනුෂංගික යයි සභාව අදහස් කරන වෙනත් සියළු ක්‍රියා සිදු කිරීම

## 1.5 සභාව සතු බලතල

1997 අංක 18 දරණ මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභා පනතේ 16 (2) (1) වන උප වගන්තිය අනුව සභාව සතු බලතල මෙසේය.

(අ) සභාවේ කර්තව්‍ය ඉටුකිරීම සඳහා අවශ්‍යවන සමීක්ෂණ, විමර්ශන, අධ්‍යයන සහ පර්යේෂණ කිරීමට.

(ආ) මානව සම්පත් සංවර්ධනයට අදාලව කරුණු සම්බන්ධයෙන් විශේෂඥයන්ගේ, වෘත්තීකයන්ගේ හෝ මහජනයාගේ මතය දැන ගැනීම සඳහා ප්‍රසිද්ධියේ හෝ පෞද්ගලිකව කරුණු විමසීමට.

(ඇ) සභාව විසින් ඉටුකරනු ලබන කර්තව්‍ය වලට සමාන කර්තව්‍ය ඉටු කරන ශ්‍රී ලංකාවෙන් බැහැර පිහිටි ජාත්‍යන්තර නියෝජ්‍යායතන සහ වෙනත් සංවිධාන සමඟ සම්බන්ධතා ඇතිකර පවත්වාගෙන යාමට.

(ඈ) මේ පනත යටතේ සභාවේ කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය වන සියළු කොන්ත්‍රාත්තුවලට සහ ගිවිසුම්වලට එළඹීමට සහ ඒවා ඉටු කිරීමට.

(ඉ) ශ්‍රී ලංකාවේ හෝ විදේශීය රටවල පිහිටි ආයතන හෝ පුද්ගලයින් මගින් මානව සම්පත් සංවර්ධන පර්යේෂණ පැවැත්වීම සඳහා කටයුතු වල යෙදීමට.

(ඊ) මානව සම්පත් සංවර්ධනය හා ඊට සම්බන්ධ ක්ෂේත්‍ර පිළිබඳව තොරතුරු දත්ත බැංකුවක් පිහිටුවා පවත්වාගෙන යාමට.

(උ) යම් බැංකුවක හෝ බැංකුවල ජංගම, ඉතිරිකිරීම් හෝ තැන්පතු ගිණුම් විවෘත කර පවත්වාගෙන යාමට.

(ඌ) චංචල සහ නිශ්චල යන දෙවර්ගයේම ආධාර හා පරිත්‍යාග පිළිගැනීමට සහ භාරගැනීමට.

(එ) මානව සම්පත් සංවර්ධනයේ විවිධ අංශවල නිපුණ විශේෂඥ සංචිතයක් සංවර්ධනය අරමුණු කර ගෙන සභාවේ නිළධරයන්ගේ දක්ෂතා වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීමට.

(ඒ) සභාවේ කර්තව්‍ය සාර්ථක ලෙස ඉටුකිරීම සඳහා අවශ්‍ය වන කමිටු විශේෂඥ කණ්ඩායම් සහ උපදේශක මණ්ඩල පත් කිරීමට.

(ඔ) අමාත්‍යාංශවලින්, ආණ්ඩුවේ දෙපාර්තමේන්තු වලින්, රාජ්‍ය සංස්ථාවලින්, ව්‍යවස්ථාපිත මණ්ඩලවලින්, පළාත් සභා වලින්, පළාත් පාලන ආයතනවලින් සහ පෞද්ගලික අංශයේ ආයතනවලින් ලබා ගන්නා සංඛ්‍යා ලේඛන ඇතුළුව සභාව විසින් අවශ්‍ය යැයි සලකනු ලබන තොරතුරු ඉල්ලා සිටීමට සහ ඒවා ලබා ගැනීමට.

(ඕ) සභාවේ කර්තව්‍ය බලතල සහ කාර්ය ඉටු කිරීම ක්‍රියාත්මක කිරීම සහ සිදු කිරීම සඳහා අවශ්‍ය යැයි හිතකර යැයි හෝ ආනුෂංගිකයයි සභාවේ මතය අනුව සභාව විසින් සලකනු ලබන සියළු පියවර ගැනීමට.

## 2. මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ සංවිධාන ව්‍යුහය

ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන මෙම සභාව 1997 අංක 18 දරණ මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභා පනතේ දැක්වෙන විධි විධාන අනුව පත් කරනු ලබන සභාපතිවරයෙකුගේ හා සාමාජිකයන් 20 දෙනෙකුගෙන් සමන්විත වේ. ඉන් 15 දෙනෙකු නිල බලයෙන් හා අදාල ආයතන වලින් 5 දෙනෙකු වශයෙනි. ඒ හැරුණු විට අදාල ක්ෂේත්‍රයන්හි පලපුරුද්ද හැකියාව යනාදිය සලකා 5 දෙනෙකු පත්කරනු ලබන අතර මින් දෙදෙනෙකු පුද්ගලික අංශයෙන් වේ. සභා සභිකයන් අතුරෙන් එක් අයෙකු විධායක සභාපති සේ නම් කිරීමට විෂයභාර ඇමතිතුමාට බලය පැවරේ. මෙහි ප්‍රධාන විධායක නිළධාරියා වනුයේ සභාවේ සභාපතිය. 2015.12.31 දින වනවිට සාමාජිකයන් 19 දෙනෙකුගෙන් සමන්විත විය.

2015.12.31 දිනට සභාවේ අධ්‍යක්ෂ මණ්ඩලය පහත සාමාජිකයන්ගෙන් සමන්විත විය.

**පනතේ 3(1) (අ) සිට (ව) දක්වා වගන්ති යටතේ කර ඇති පත්වීම්**

1. සභාපති, මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව
2. ලේකම්, ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය
3. ලේකම්, උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය
4. ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය
5. ලේකම්, විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය
6. ලේකම්, කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය
7. ලේකම්, රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය
8. ලේකම්, සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
9. ලේකම්, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය
10. ලේකම්, වාරිමාර්ග හා කෘෂිකර්ම අමාත්‍යාංශය
11. සභාපති, තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව
12. අධ්‍යක්ෂ ජෙනරාල්, තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව
13. සභාපති, ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව
14. සභාපති, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
15. සභාපති, ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය
16. ලේකම්, මුදල් අමාත්‍යාංශය


**පනතේ 3(2) (ජ) වගන්තිය යටතේ කර ඇති පත්වීම**

1. මහාචාර්ය කාමෙනා ගුණරත්න මිය - පීඨාධිපති, මානව හා සමාජ විද්‍යා පීඨය, විවෘත විශ්ව විද්‍යාලය
2. ආචාර්ය රංගික හල්වතුර මහතා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, මොරටුව විශ්ව විද්‍යාලය
3. වෛද්‍ය රනිල් අබේසිංහ මහතා - 178, ජෝර්ජ් ද සිල්වා මාවත, මහනුවර

**2015 වර්ෂයේ මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ පාලක මණ්ඩල රැස්වීම් පැවැත්වූ දිනයන් හා සහභාගී වූ සාමාජිකයන් පිලිබඳ විස්තර**

| අනු අංකය | පාලක මණ්ඩල සාමාජිකයාගේ නම | 2015.04.21 | 2015.06.10 |
|---|---|---|---|
| 01 | සභාපති, මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව | √ | √ |
| 02. | ලේකම්, ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යංශය | √ | - |
| 03. | ලේකම්, උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යංශය | √ | √ |
| 04. | ලේකම්, අධ්‍යාපන අමාත්‍යංශය | - | - |
| 05. | ලේකම්, විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යංශය | - | - |
| 06. | ලේකම්, කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යංශය | - | √ |
| 07. | ලේකම්,රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යංශය | - | √ |
| 08. | ලේකම්, සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යංශය | - | √ |
| 09. | ලේකම්,කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යංශය | √ | - |
| 10. | ලේකම්, වාරිමාර්ග හා කෘෂිකර්ම අමාත්‍යංශය | - | - |
| 11. | සභාපති,තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව | - | - |
| 12. | අධ්‍යක්ෂ ජෙනරාල්, තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව | √ | √ |
| 13. | සභාපති, ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව | √ | √ |
| 14. | සභාපති, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව | - | - |
| 15. | සභාපති, ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය | - | √ |
| 16. | ලේකම්,මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යංශය (නියෝජිත) | √ | √ |
| 17. | **පත්කල සාමාජික -** මහාචාර්ය කාමෙනා ගුණරත්න මිය | √ | - |
| 18. | **පත්කල සාමාජික -** ආචාර්ය රංගික හල්වතුර මහතා | √ | √ |
| 19· | **පත්කල සාමාජික -** වෛද්‍ය රනිල් අබේසිංහ මහතා | √ | √ |

## 3.මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ සංවිධාන ව්‍යුහය



## 4.මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ සේවය කරන ලද සේවක ලැයිස්තුව හා ඔවුන්ගේ තනතුරු

| තනතුරු නාමය | අනුමත සේවක සංඛ්‍යාව | 2015.12.31 දිනට සේවයේ යෙදී සිටින සංඛ්‍යාව | 2015.12.31 දිනට පුරප්පාඩු සංඛ්‍යාව | නම |
|---|---|---|---|---|
| සභාපති | 01 | 01 | - | දිනේෂ් වීරක්කොඩි මහතා |
| අධ්‍යක්ෂ | 01 | 01 | - | කේ.ඒ. ලලිතධීර මහතා |
| සහකාර අධ්‍යක්ෂ | 03 | 03 | - | ජේ.ඒ.සී.පී. ජයසිංහ මිය<br>එස්. තනගසීලන් මහතා<br>යූ.එස්.ටී. විතානගේ මහතා |
| සභා ලේකම්/නීති නිලධාරි | 01 | 01 | - | ජී.ජී. කසුනි උත්පලා මෙනවිය |
| පර්යේෂණ නිලධාරි | 04 | 04 | - | ආර්.එම්.ඒ. යූ.කේ. රත්නායක මිය<br>ඒ.එච්.ඩී.සී. පෙරේරා මිය<br>ඩී. සෙන්තිල්නාදන් මහතා<br>නවෝදා එදිරිසිංහ මෙනවිය |
| පරිපාලන නිලධාරි | 01 | - | 01 | |
| භාෂා පරිවර්තක | 01 | - | 01 | - |
| සංවර්ධන නිලධාරි | 04 | 04 | - | පී.ඊ.එස්. සේනාරත්න ද සිල්වා මිය<br>ආර්.ඩී.සී.එස්. රාජපක්ෂ මහතා<br>කේ.පී.පී. පෙරේරා මහතා<br>කේ.සී. ගුරුසිංහ මෙනවිය |
| සභාපතිගේ පෞද්ගලික සහකාර | 01 | - | 01 | - |
| කළමනාකරණ සහකාර | 08 | 07 | 01 | චාමිනි කාරියවසම් මිය<br>සී.ආර්. මද්දගේ මහතා<br>එම්.ජී.එන්. දිල්හාරි මෙනවිය<br>ඩබ්.එම්. ලක්ෂිත රජිත් මහතා<br>කේ.සී. මුතුමාල මෙනවිය<br>ජී.පී.එම්. සද්ධාමංගල මෙනවිය<br>ආශා සුරේණි එදිරිසිංහ මෙනවිය |
| රියැදුරු | 04 | 04 | - | ජී.එම්. පින්නදූව මහතා<br>ඩබ්.එච්.ඊ. ජයරත්න මහතා<br>ඩබ්.ටෙරන්ස් පියල් මහතා<br>ඩී.එච්.ඩබ්. අසංක ලක්මාල් මහතා |
| කාර්යාල සහායක | 04 | 03 | 01 | එන්.ජී. නදුන් මධුරංග මහතා<br>ඩබ්.ආර්.ඒ. ප්‍රින්ස් ග්‍රැන්විල් මහතා<br>ඒ. නයනා ප්‍රියදර්ෂණී මෙනවිය |
| **මුළු එකතුව** | **33** | **28** | **05** | |

අනුමත කාර්ය මණ්ඩලය තුල මෙම වසරේදී පහත සඳහන් පුරප්පාඩු තනතුරු සඳහා සුදුසුකම් ලත් නිලධාරීන් බඳවා ගැනීම සිදු කරන ලදී.

**නව බඳවා ගැනීම්**

| නම | තනතුර | බඳවාගත් දිනය |
|---|---|---|
| 1. දිනේෂ් වීරක්කොඩි මහතා | සභාපති | 2015.02.26 |
| 2. නවෝදා එදිරිසිංහ මෙනවිය | පර්යේෂණ නිලධාරී | 2015.10.21 |

**සේවයෙන් ඉල්ලා අස්වීම්**

| නම | තනතුර | ඉල්ලා අස්වූ දිනය |
|---|---|---|
| 1. විජය වික්‍රමරත්න මහතා | සභාපති | 2015.01.23 |

# 5.වැඩසටහන් හා ව්‍යාපෘති

## 5.1 දින 100 වැඩසටහන

නව රජය මගින් ක්‍රියාවට නංවන ලද දින 100 වැඩසටහනෙහි අඩංගු පහත සඳහන් අංක 31, 55 හා 58 යටතේ දක්වා ඇති කර්තව්‍යයන් ඉටු කර ගැනීම සඳහා මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව මගින් ප්‍රවීන විද්වතුන්ගෙන් සමන්විත කමිටු හරහා ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට අවශ්‍ය නිර්දේශ සපයන ලදී.

31. අපේ තරුණ පරපුරේ අසහනයට මුල් වී ඇති විරැකියාව සහමුලින්ම තුරන් කිරීම ඉලක්ක කරගත් දේශිය හා විදේශීය රැකියා හා ස්වයං රැකියා දස ලක්ෂයක් සැපයීමේ වැඩසටහන ආරම්භ කිරීම.
55. අධ්‍යාපනය සඳහා ලබා දෙන ප්‍රතිපාදන ද.දේ.නි 1.5% සිට 6% දක්වා අවුරුදු 5ක් තුල වැඩි කිරීම.
58. උසස් පෙළ විෂයයන් තුනක් සමත් සියළු දෙනාට උසස් ඩිප්ලෝමාවක් හෝ උපාධියක් දක්වා ඉගෙන ගැනීමට අවශ්‍ය අවකාශ සම්පාදනය කිරීම.

නව රජය මගින් ක්‍රියාවට නංවන ලද දින 100 වැඩසටහනෙහි අංක **58 යටතේ උසස් පෙළ විෂයන් තුනක් සමත් සියළු දෙනාට උසස් ඩිප්ලෝමාවක් හෝ උපාධියක්** දක්වා ඉගෙන ගැනීමට අවශ්‍ය අවකාශ සැලසීම යටතේ පැවැත්වූ වැඩමුළු හරහා පහත යෝජනා ඉදිරිපත් කරන ලදී.

1. දේශීය විශ්වවිද්‍යාල සඳහා සුදුසුකම් ලැබූවන් අතරින් බඳවාගන්නා ප්‍රමාණය වැඩි කිරීම
2. සුදුසුකම් ලැබූවන් සඳහා රාජ්‍ය ආයතනවල තෘතියික අධ්‍යාපනය හැදැරීමට පවතින ප්‍රවේශයන් පුළුල් කිරීම
3. තෘතීයික අධ්‍යාපනය ලබාදෙන පෞද්ගලික ආයතන ඒකාබද්ධ කිරීම



**හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂන ආයතනයේ පැවැත්වූ වැඩමුළුව**



**කණ්ඩායම් සාකච්ජා පැවැත්වීම**

**අංක 55 යටතේ අධ්‍යාපනය සඳහා ලබා දෙන ප්‍රතිපාදන ද.දේ.නි 1.5% සිට 6% දක්වා අවුරුදු 5ක් තුල වැඩි කිරීම යන තේමාව යටතේ පැවැත්වූ සාකච්ජා හරහා කමිටුව ලබාදුන් නිර්දේශ -**

මහාචාර්ය මාරි පෙරේරා, මහාචාර්ය ලක්ෂ්මන් ජයතිලක, මහාචාර්ය මලික් රණසිංහ හා මහාචාර්ය පී.එස්.එම්. ගුණරත්න යන අයගේ මූලිකත්වය යටතේ පිළිවළින් ප්‍රාතමික, ද්විතීයික, තෘතීයික, වෘත්තීය අධ්‍යාපන හා උසස් අධ්‍යාපන යන අංශ සඳහා ක්ෂේත්‍රයක්හි ප්‍රවීනයන්ගෙන් සමන්විත කමිටු හරහා කණ්ඩායම් සාකච්ජා පවත්වා අධ්‍යාපනය සඳහා දළ දේශීය නිශ්පාදිතයෙන් 1.5% සිට 6% දක්වා කෙසේ වැඩි කලයුතුද යන්න සඳහා පහත නිර්දේශ ඉදිරිපත් කරන ලදි.

1. ප්‍රාතමික අධ්‍යාපනය, අධ්‍යාපන අමාත්‍යාංශයේ පාලනයට නතු කිරීම සහ අදාල යටිතල පහසුකම් සැලසීම
2. විශේෂ අවශ්‍යතා ඇති එනම් මානසික සමාජීය ගැටළු වලින් හා අබාධිත තත්වයේ පසුවන සිසුන් පිළිබඳ වැඩි අවධානයක් යොමු කිරීම
3. උ.පෙළ විද්‍යා විෂය ධාරාව උගන්වන පාසැල් 900 සිට 1500 දක්වා වැඩි කිරීම සහ තාක්ෂණ විෂය ධාරාව උගන්වන පාසැල් 250 සිට 1000 දක්වා වැඩි කිරීම
4. ඉංග්‍රීසි, ගණිතය සහ විද්‍යා විෂයයන් උගන්වන ගුරුවරුන්හට ඔවුන්ගේ හැකියාව හා දක්ෂතාව මත දිරි දීමනාවක් ලබාදීම
5. අධ්‍යාපනය ක්ෂෙත්‍රයට අදාල පර්යේෂණ වැඩිපුර සිදු කිරීම සඳහා ඒ වෙනුවෙන් ජාතික අධ්‍යාපන ආයතනයට ලබාදෙන වාර්ෂික ප්‍රතිපාදන ප්‍රමාණය වැඩි කිරීම
6. උසස් අධ්‍යාපනය ලැබීමට සුදුසුකම් ලැබූ සිසුන්හට තෘතීයික, වෘත්තීය හා වෘත්තීය අධ්‍යාපන කේෂ්ත්‍රයන්හි ඔවුන්ගේ කැමැත්ත පරිදි කැමති අංශයකින් අධ්‍යාපනය හැදෑරීම සඳහා වැයවන වියදම් ආවරණය කර ගැනීම සඳහා වවුචර් ක්‍රමය මගින් අවකාශ සැලසීම
7. පෞද්ගලික විශ්ව විද්‍යාල වලට සමගාමීව උසස්පෙළින් පසු අවම වශයෙන් මාස 6කට පසුවවත් රාජ්‍ය විශ්ව විද්‍යාල වලට ඇතුළත් කර ගැනීම කඩිනම් කිරීම
8. උසස් අධ්‍යාපනය සඳහා බඳවා ගන්නා ප්‍රමාණය 17% සිට 25% දක්වා වැඩි කිරීම
9. පශ්චාත් උපාධි ලබාගැනීම සඳහා රාජ්‍ය අනුග්‍රහය ලබාදීම, ජාත්‍යන්තර රැකියා හා සමුළු සඳහා සහභාගි වීම තුළින් විශ්ව විද්‍යාල කාර්ය මණ්ඩලය සවිබල ගැන්වීම
10. දේශීය විශ්ව විද්‍යාල මගින් සිදුකරනු ලබන පර්යේෂන වල ගුණාත්මකභාවය ඉහල නැංවීම සඳහා මාස 3-6 කාල පරිච්ඡේදයකට ඉහළ පෙළේ ජාත්‍යන්තර විද්වතුන්ගේ සේවය ලබා ගැනීමට ඉඩ සැලසීම
11. ජාත්‍යන්තර ප්‍රතීතනය හා විදේශීය බාහිර පරීක්ෂකවරුන් මගින් උසස් අධ්‍යාපනයේ තත්ව ප්‍රමිතිය සහතික කරවා ගැනීම

**අංක 31. අපේ තරුණ පරපුරේ අසහනයට මුල් වී ඇති විරැකියාව සහමුලින්ම තුරන් කිරීම ඉලක්ක කරගත් දේශීය හා විදේශීය රැකියා හා ස්වයං රැකියා දස ලක්ෂයක් සැපයීමේ වැඩසටහන ආරම්භ කිරීම යන තේමාව යටතේ පැවැත්වූ සාකච්ජා හරහා කමිටුව ලබාදුන් නිර්දේශ -**

දේශීය විශ්ව විද්‍යාල මගින් පිටවන උපාධිධාරීන් බොහෝමයක් විරැකියාවෙන් පෙළීම නොරහසකි. රැකියාවේ සුරක්ෂිතභාවය හා පිළිගැනීම නිසා අවම වැටුපක් ගෙවුවද ඔවුන් රජයේ රැකියා ලබා ගැනීමට අපේක්ෂා කරති. ඒ අතරම පෞද්ගලික අංශයේ රැකියා සපයන්නන් රැකියාවන් සඳහා සුදුසුසන් තෝරා ගැනීමේ අභියෝගයකට මුහුණ පාති. දරිද්‍රතාවය, සමාජ අනාරක්ෂිතභාවය හා දේශපාලන අස්ථාවරභාවය යන සාධක රටෙහි දැවෙන ප්‍රශ්ණ වලට මූලික හේතූන් වේ. එබැවින්, නව රජය දින 100 වැඩසටහන යටතේ විරැකියා අනුපාතය අවම කිරීම අරමුණින් රැකියා දශ ලක්ෂයක් ඇති කිරිම සහ අවුරුදු පහ තුළ ශ්‍රම බලකා අනුපාතය වැඩි කිරීම සඳහා ප්‍රමුඛත්වය දෙන ලදී.

මීළග අවුරුදු පහ තුළ පහත සඳහන් ආර්ථික අංශ අටක දේශිය රැකියා ප්‍රක්ශේපිත ඉල්ලුම මිලියන 10 ක් පමණ වන බවත් සොයා ගෙන ඇත.

1. කෘෂිකර්ම, ධීවර හා වන වගා
2. නිශ්පාදන අංශය
3. ඉදිකිරීම්, කැනීම්, විදුලිය, ගෑස් සහ ජල සම්පාදන
4. තොග වෙළදාම් හා සිල්ලර වෙළදාම්, මෝටර් රථවාහන, භාණ්ඩ
5. හෝටල් හා සංචාරක
6. ප්‍රවාහන, ගබඩා හා සංනිවේදන
7. මූල්‍ය. වතු, හා ව්‍යාපාර
8. වෙනත්

කෘෂිකර්ම, නිෂ්පාදන, ඉදිකිරීම්, හෝටල්/සංචාරක, ප්‍රවාහන/ගබඩා/සංනිවේදන, මූල්‍ය සහ වෙනත් යන අංශයන්හි ඵලදායිතාව වැඩිවෙමින් පවති. කෙසේ වෙතත් හෝටල්/සංචාරක සහ ඉදිකිරීම් අංශයන්හි ද.දේ.නි වැඩි ප්‍රතිශතයක් දායක වේ. වර්තමාන ප්‍රක්ශේපිත රැකියා ද.දේ.නි. හා ඵලදායිතාව මත පදනම් වී ඇති අතර කමිටුව පහත කර්තව්‍යයන් නිර්දේශයන් ඉදිරිපත් කරන ලදි.

- ❖ අනු අංශ අනුව ප්‍රක්ශේපිත රැකියා වර්ධනය
- ❖ මෙම රැකියා ලබා දීම සඳහා අදාල සැලසුම් සකස් කිරීම
- ❖ විදේශිය රැකියා සඳහා රාජ්‍ය මැදිහත්වීම



**රැකියා දශලක්ෂ වැඩසටහන සඳහා පැවැත්වූ වැඩමුළුව**

මේ යටතේ අප ආයතනය මගින් **"රැකියා අරුණ" වෘත්තීය අභිප්‍රේරණ වැඩසටහන** පොළොන්නරුව හා ගම්පහ යන දිස්ත්‍රික්කයන්හිදී පහත පරිදි පවත් වන ලදී.

## 5.2 "රැකියා අරුණ" වෘත්තීය අභිප්‍රේරණ වැඩසටහන

වෘත්තීය මාර්ගෝපදේශණය අනාගතයේ තමන් තෝරාගත යුතු වෘත්තීයට අදාල පරිදි අධ්‍යාපනය හා නිපුණතා සංවර්ධන පාඨමාලා තෝරා ගැනීමට පාසැල් සිසුන් සඳහාත්, පාසැල් හැර ගිය සිසුන් සඳහාත්, විශ්ව විද්‍යාල සිසුන් සඳහාත් අත්‍යවශ්‍ය අංගයකි. එහෙත් දැනට වෘත්තීය පුහුණු ආයතන තම තමන්ට ආවේනික වෘත්තීය මාර්ගෝපදේශ වැඩ සටහන් ක්‍රියාත්මක කරන අතර අධ්‍යාපන අමාත්‍යාංශය පාසැල් තුල ක්‍රියාත්මක කරන වැඩ සටහන් ඊට හාත්පසින්ම වෙනස් වන අතර පොදු වෘත්තීය මාර්ගෝපදේශණ වැඩසටහනක් සකස් කර ඔවුන්ව නිසි පුහුණුවට යොමු කිරීමත් රැකියාගත කිරීමත් කාලීන අවශ්‍යතාවයකි.

එබැවින් මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව දිවයින පුරා විසිරී සිටින පාසැල් හැරගිය සිසුන්හට වෘත්තීය සුදුසුකම් සපුරා ගැනීමටත්, පෞද්ගලික අංශයේ රැකියා වෙත යොමු වීම සම්බන්ධයෙන් පවතින ආකල්පයන් වෙනස් කිරීමත්, සපුරා ඇති සුදුසුකම් මත පෞද්ගලික අංශයේ රැකියා වෙත යොමු කිරීමත් අරමුණු කර ගනිමින් **"රැකියා අරුණ" වෘත්තීය අභිප්‍රේරණ වැඩසටහන** ආරම්භ කරන ලදී.

මෙම ව්‍යාපෘතියේ අරමුණ වන්නේ රාජ්‍ය අංශයේ පවතින යටිතල පහසුකම් උපයෝගී කරගනිමින් පාසැල් හැරගිය සිසුන්ගේ වෘත්තීය පුහුණු අවශ්‍යතා ඉටු කරලීම සඳහා අවශ්‍ය සැලසුම් හා මැදිහත් වීම සිදු කිරීම, වෘත්තීය පුහුණු අවස්ථා සහ රැකියා අවස්ථා පිළිබඳ රැකියා අපේක්ෂකයින්ගේ තොරතුරු පරතරය අවම කිරීමයි. මේ සඳහා මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ සභාපති දිනේෂ් වීරක්කොඩි මහතාගේ උපදෙස් පරිදි සහ මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ අධ්‍යක්ෂක කේ.ඒ.ලලිතධීර මහතාගේ මග පෙන්වීම යටතේ ජාතික වාණිජ මණ්ඩලය, වෘත්තීය පුහුණු ආයතන, කලාප අධ්‍යාපන කාර්යාල සහ දිස්ත්‍රික් ලේකම් සහ සියලු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල සහයෝගයෙන් 2015 නොවැම්බර් 04 දින පොළොන්නරුව පුලතිසි බුද්ධි මණ්ඩපයේදීත් 2015.12.10 ගම්පහ දිස්ත්‍රික්කයේදීත් පෙ.ව 9.00 සිට ප.ව 4.00 දක්වා රැකියා අරුණ වෘත්තීය අභිප්‍රේරණ වැඩසටහන් 2ක් පවත්වන ලදී.

මෙම වැඩසටහන සඳහා ජාතික වාණිජ මණ්ඩලයේ සම්බන්ධීකරණය මගින් පෞද්ගලික අංශයේ කර්මාන්ත ශාලා 23 ක් සහභාගී විය. එමෙන්ම රැකියා අපේක්ෂිත දරු දැරියන් 1500 ක් පමණ මෙම වැඩසටහන සඳහා සහභාගී වූ අතර ඔවුන් අතරින් 1000කට පමණ සංඛ්‍යාවක් එම දිනයේදී රැකියා

අවස්ථා සඳහා  එම ආයතන මගින් බඳවා ගැනීම් සිදු කරන ලදී.  මෙම වැඩසටහන අප සභාවේ අරමුණ අනුව ඉතාමත් සාර්ථක වැඩසටහනක් විය.



පොළොන්නරු දිස්ත්‍රික් වැඩමුළුව



ගම්පහ දිස්ත්‍රික් වැඩමුළුව

## 5.3 මාතර දිස්ත්‍රික්කයේ සංවර්ධන අවශ්‍යතා හඳුනා ගැනීම

මානවයාගේ වර්තමාන පැවැත්ම කෙරෙහි පමණක් නොව අනාගත අභිවෘද්ධිය සඳහා ද බලපානු ලබන ප්‍රධාන සංකල්පයක් ලෙස සංවර්ධනය අද වන විට මුළු ලෝකයාම පිළිගෙන ඇත. රටක් ආර්ථික වෘද්ධියක් ලඟාකර ගත් පමණින් එම රට සංවර්ධිතයැයි අර්තකථනය කළ නොහැක. මන්ද, ආර්ථික වෘද්ධියේ ප්‍රතිලාභ සෑම ජන කොටසක් අතරම බෙදී ගොස් තිබේනම් එනම් අසමානතාවය අවම වී පවතීනම් එම රට සංවර්ධිත රටක් ලෙස අර්තකථනය කළ හැකිය. එබැවින් මෙම සංවර්ධන සංකල්පය සම්බන්ධ බොහෝ පර්යේෂණ හා අධ්‍යයන සිදු කිරීම කාලීන අවශ්‍යතාවයක් බවටද පත්ව ඇත.

ජාතික ප්‍රතිපත්ති  හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය යටතේ පවතින ආයතනයක් වශයෙන් මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව 2014- 2015 වර්ෂවල මාතර දිස්ත්‍රික්කයේ සංවර්ධන අවශ්‍යතා හඳුනා ගැනීම සම්බන්ධ අධ්‍යයනයක් සිදුකරන ලදී. විශේෂයෙන්ම මෙම අධ්‍යයනය තුළින් පසුගිය කාලවකවානුව තුළ ක්‍රියාත්මක වූ සංවර්ධන ව්‍යාපෘති වලින් ප්‍රදේශයේ ජනතාවට සිදු වූ බලපෑම් සොයා ගැනිමත්, ප්‍රදේශයේ සිදුවන සමාජ විරෝධී ක්‍රියාවල ප්‍රවණතාවය හඳුනා ගැනීමත්,  මෙම ප්‍රදේශයේ ජීවත් වන ජනතාවගේ මූල්‍ය පහසුකම් සහ ඉතිරි කිරිම් සම්බන්ධ පුරුදු අධ්‍යයනය කිරීමත්, ප්‍රදේශයේ පවතින පාරිසරික ගැටළු හේතුවෙන් මිනිස් ජීවිත වලට සිදුවන බලපෑම් කවරේද යන්නත් හඳුනා ගැනීමත් ප්‍රධාන වශයෙන් මෙම අධ්‍යයනය තුළින් අපේක්ෂා කරන ලදී.

මෙම අධ්‍යයනය සඳහා මාතර දිස්ත්‍රික්කයේ සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකම ග්‍රාමීය, නාගරික සහ වතු යන සෑම ජන කොට්ඨාශයක්ම නියෝජනය වන පරිදි ගෘහ මූලික ඒකක 3000 කින් සැඳුම්ලත් පක්ෂපාති නොවන නියැදියක් ද්විකලා නියැදීම් ක්‍රමය යටතේ තෝරා ගන්නා ලද අතර (Two phase Sampling Technique) එයින් ප්‍රතිචාර ලබා දුන් 2111ක ගෘහ මූලිකයන් පිරිසක් අධ්‍යයනය සඳහා පාදක කරගන්නා ලදී.

මෙම අරමුණු සාධනය කර ගැනීම සඳහා දත්ත රැස් කිරීමේ ශිල්පීය ක්‍රමවේදය වශයෙන් යොදාගනු ලැබුවේ ප්‍රශ්නාවලි ක්‍රමයයි. විශේෂයෙන්ම මෙම ප්‍රශ්නාවලිය සකස් කිරීමට පූර්වයෙන් මාතර දිස්ත්‍රික්කයේ සමාජ, ආර්ථික දේශපාලනික, සංස්කෘතික හා අධ්‍යාපන ආදී ක්ෂේත්‍රයන්ට අදාළ තත්කාලීන ගැටළු හඳුනා ගැනිම සඳහා එම ක්ෂේත්‍ර නියෝජනය කරනු ලබන රාජ්‍ය සේවකයන්ගේ සහභාගිත්වයෙන් මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2014.11.10 හා 2014.11.11 යන දෙදින තුළ වැඩමුළු පවත්වන ලදී. එහිදී එම විද්වත් මඩුල්ලෙන් ලබාගත් අදහස් ද සැලකිල්ලට ගෙන සකස් කරන ලද ප්‍රශ්නාවලි පුහුණු කිරීමේ වැඩසටහනකින් අනතුරුව ග්‍රාම නිලධාරී කොට්ඨාශ 30ක ග්‍රාම නිලධාරීන් වෙත පවරණ ලදී. අනතුරුව ප්‍රශ්නාවලි හරහා ලබා ගන්නා ප්‍රාථමික දත්තත් මාතර දිස්ත්‍රික්කයේ ආර්ථික, සමාජීය, පාරිසරික ක්ෂේත්‍ර නියෝජනය කරමින් එම ක්ෂේත්‍රවල ප්‍රධාන නිලධාරීන්ද, මාතර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් සහකාර සැළසුම් අධ්‍යක්ෂකවරුන්ද, මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සංඛ්‍යාලේඛනඥයාද සමඟ පවත්වන ලද සාකච්ඡා මඟින්ද මෙම අධ්‍යයනය සඳහා අවශ්‍ය ද්විතීයික දත්ත ද රැස්කරගනු ලැබීය.

රැස්කර ගන්නා ලද ප්‍රාථමික හා ද්විතික දත්ත විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව හඳුනාගත හැකි වූයේ මෙම ප්‍රදේශයේ බහුතරයක් ගෘහ මූලිකයින් ද්විතික අධ්‍යාපනයක් ලද පිරිසක් වුවද සැළකියයුතු බහුතරයකට ස්ථිර රැකියා අවශ්‍යතා නොමැති බවත්, ස්ථිර රැකියාවක් නොමැති කාන්තා ප්‍රතිශතය පුරුෂ ප්‍රතිශතයට වඩා අධික බවත්ය.

එමෙන්ම මෙම ප්‍රදේශයේ ජනතාව විශාල මට්ටමේ ආදායම් ඉපයීමේ ශක්‍යතාවක් නොමැති ජනතාවක් බවත්, ජනතාව වැඩි වශයෙන් කවර හෝ ආකාරයකින් ණය ලබා ගැනිමට පෙළඹී ඇති බවත්ය. එමෙන්ම ජනතාව අවම වශයෙන් අවිධිමත් ණය මූලාශ්‍ර වෙත යොමු වී ඇති බවත් ඒ තුළින් ඔවුන් ග්‍රාමීය ණය උගුලට නතුවීමට පවතින ශක්‍යතාවය අවම බවත් මෙම අධ්‍යයනය තුළින් සනාථ විය. එමෙන්ම මාතර දිස්ත්‍රික්කය තුළ මිනී මැරුම් සහ කෝලහල, සොරකම්/ මං පැහැරීම් වැනි බරපතල අපරාධ අවම මට්ටමක පවතින බවත් මත් ද්‍රව්‍ය හා දුම්වැටි භාවිතය ඉහළ මට්ටමක පවතින බවත් නිගමනය විය.

ප්‍රදේශයේ පවතින සුළු හා මධ්‍ය පරිමාණ සංවර්ධන ව්‍යාපෘති අතරින් නිවාස සංවර්ධන, පොදු ප්‍රවාහන සේවාවක් වන බස් රථ සේවාව, පොදු ළිං /කෘෂි ළිං /නල ළිං ලබා දීමේ ව්‍යාපෘති, කෘෂි කර්ම සංවර්ධනය හා සම්බන්ධ ව්‍යාපෘති, කර්මාන්ත සංවර්ධන ව්‍යාපෘති හා රැකියා ලබා දීමේ වැඩසටහන්

ප්‍රශස්ථ මට්ටමක නොමැති බවද පාසැල් අධ්‍යාපනය හා සම්බන්ධ ව්‍යාපෘති, විදුලිබල ව්‍යාපෘති, මාර්ග සංවර්ධන ව්‍යාපෘති හා දිවි නැගුම/ සමෘද්ධි වැනි ව්‍යාපෘති ප්‍රශස්ථ මට්ටමක ඇති බවත් වෘත්තීය පුහුණු ව්‍යාපෘති පිළිබඳ සලකා බැලීමේදී එම ව්‍යාපෘති ලැබී ඇති ප්‍රමාණය අවම වන අතර ව්‍යාපෘති පුහුණු ලැබී ඇති පිරිස තුළ ඒ පිළිබඳව ඉතා හොඳ ආකල්පයක් පවතින බවද, මහා පරිමාණ ව්‍යාපෘති අතරින් නිල්වලා ව්‍යාපෘතිය පිළිබඳ ජනතාවගේ තක්සේරුව සම්බන්ධයෙන් ගත් කල්හි මෙම ව්‍යාපෘතිය සාමාන්‍ය මට්ටමෙන් ප්‍රතිඵල ලද ව්‍යාපෘතියක් බවද, මාතර කතරගම දුම්රිය මාර්ග ව්‍යාපෘතිය හා මාතර කොළඹ අධිවේගී මාර්ග ව්‍යාපෘතිය ප්‍රශස්ත මට්ටමක ඇති බවද ජනතාවගේ තක්සේරු අනුව මෙම අධ්‍යයනය මඟින් නිගමනය විය. මීට අමතරව ජන ජීවිතයට බලපෑම් කරනු ලබන සතුන් අතර මොණරුන්, වඳුරන් හා සුනඛයන් මුල් තැනක් ගෙන ඇති බවත් මාතර දිස්ත්‍රික් ජනතාවගේ ප්‍රතිචාර අනුව පැහැදිලි වී ඇත.

මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවට පැවරී ඇති ප්‍රධාන කාර්යයක් වනුයේ සමාජීය අවශ්‍යතාවයන්ට අනුව පර්යේෂණ හා අධ්‍යයනයන් සිදු කරමින් ඒ තුළින් අදාළ නිර්දේශ ලබාදීමයි. එකී කාර්යයට අනුගතව සිදුකල මෙම මාතර දිස්ත්‍රික් අධ්‍යයනය තුළින්ද අනාගත සංවර්ධන කටයුතු සම්බන්ධ ප්‍රතිපත්ති සම්පාදනය කිරීමට දායක කර ගත හැකිය. එය කෙසේද යත් මෙමඟින් දැනට ක්‍රියාත්මක වන සංවර්ධන වැඩසටහන්වල ඵලදායිතාවය වැඩිකර ගැනීමටත් ඒවායේ පවතින දුර්වලතා හඳුනා ගැනීමටත් එම දුර්වලතා අවම කර ගැනිමටත් මෙබඳු අධ්‍යයන පිටුවහලක් වන බැවිනි.


## 5.4 වෘත්තීය පුහුණුව සහ රැකියා ගත වීම සම්බන්ධ ඡායා අධ්‍යයනය -මාතර දිස්ත්‍රික්කය

ශ්‍රී ලංකාවේ සුවහසක් තරුණ ප්‍රජාවට වෘත්තිය පුහුණුවක් ලබා දීම සඳහා රාජ්‍ය අංශය විසින් දැවැන්ත කාර්යය භාර්යයක් ඉටු කරනු ලබයි. සැබවින්ම එම වෘත්තීය පුහුණුව පුහුණු ලාභින්ගේ වෘත්තිය උන්නතිය, ඔවුන්ගේ ජීවිත අභිවෘද්ධිය සඳහා ප්‍රමාණවත්, ගුණාත්මකද එසේ නොමැතිනම් එම ගුණාත්මක මට්ටමට වෘත්තිය පුහුණු ආයතනවල පාඨමාලා පත් කර ගත යුත්තේ කෙසේදැයි සොයා බැලීම වැදගත්වේ.

මාතර දිස්ත්‍රික්කයේ පුහුණු ආයතන වලින් පුහුණුව ලැබුවන් ඉලක්ක කර ගනිමින් මානව සම්පත් සංවර්ධනය කිරිමේ ජාතික සභාව ඡායා අධ්‍යයනයක් සිදු කළ අතර වෘත්තීය පුහුණු ආයතන වලින් වසර තුනකට ප්‍රථම වෘත්තීය පුහුණුව ලැබුවන් වසර තුනකින් පසු කොතරම් සාර්ථකත්වයක් අත් කරගෙන ඇත්ත යන්න පිළිබඳවත් එසේම එම ආයතනවල පුහුණු ක්‍රියාවලිය, එයට සම්බන්ධ අනෙකුත් ක්‍රියාවලින් පිළිබඳව මෙම පර්යේෂණය හරහා අධ්‍යයනය කර ඇත.

මෙම අධ්‍යයනය ගවේශනාත්මක අධ්‍යයනයක් ලෙස සිදුකරනු ලැබීය. මානව සම්පත් සංවර්ධනය කිරිමේ ජාතික සභාව මාතර දිස්ත්‍රික්කයේ වෘත්තීය පුහුණු ආයතන වන වෘත්තිය පුහුණු අධිකාරිය (VTA), ජාතික තරුණසේවා සභාව(NYSC), කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරිමේ දෙපාර්තමේන්තුව (DTET), ජාතික ආධුනිකත්ව කාර්මික පුහුණු කිරිමේ අධිකාරිය(NAITA) යන ආයතන වල 2011, 2012 වර්ෂවල පාඨමාලා හැදැරූ පිරිස් මෙම අධ්‍යයනය සඳහා තෝරා ගන්නා ලදි. ස්තෘත නියැදිම යොදා ගනිමින් පුහුණු ලාභින් 4881කින් 3000ක් අධ්‍යයනය සඳහා යොදා ගත් අතර තැපැල් මාර්ගිකව ප්‍රශ්නාවලි ඔවුන් වෙතට ලබා දෙනු ලැබීය. නැවත අප වෙත ලැබී ඇති ප්‍රශ්නාවලි අනුව 536ක නියැදියක් මෙම අධ්‍යයනය සඳහා යොදා ගන්නා ලදී.

මෙම අධ්‍යයනයෙන් වැදගත් අනාවරණ රැසක් ලැබී ඇත. පුහුණුව ලැබුවන් වැඩි පිරිසක් ස්ත්‍රීන් වන අතර පුරුෂ නියෝජනය පහළ මට්ටමක පැවතුනි. එයින් 60.4% ස්ත්‍රීන් වු අතර පිරිමි 39.6% ක නියෝජනයක් පැවතුණි. ස්ත්‍රීන් වෘත්තීය පුහුණු ලැබීමට යොමු වීම සංවර්ධනය වෙමින් පවතින රටක් වශයෙන් ශ්‍රී ලංකාවට ඉතා හොඳ ප්‍රවනතාවයක් වේ.




තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් 2011 සහ 2012 වර්ෂවල ශ්‍රම වෙළඳපොළ තොරතුරු සඟරා වල දක්වන පරිදි පාඨමාලාවන් අවසන් කළ වෘත්තිය පුහුණුලාභින්ගේ බහුතරය පුරුෂයන් වේ. 2011 වර්ෂයේ ජාතික මට්ටමින් වෘත්තීය පුහුණු අධිකාරිය(VTA), ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය(NAITA), කාර්මික අධ්‍යාපන පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව(DTET) හා ජාතික තරුණ සේවා සභාව(NYSC) යන ආයතන මඟින් පුරුෂයින් 30582 (57%)ක්ද කාන්තාවන් 23368(43%) ක්ද (TVEC, Labour Market Information Bulletin, 2011) වෘත්තිය පුහුණුව ලබා අවසන් කර ඇත. එසේම 2012 වර්ෂයේ පුරුෂයින් 41971(54%)ක්ද කාන්තාවන් 36491(46%)ක්ද (TVEC, Labour Market Information Bulletin, 2012) උක්ත ආයතන 4 මඟින් වෘත්තිය පුහුණුව ලබා අවසන් කර ඇත.


නමුත් අප විසින් මාතර දිස්ත්‍රික්කයට අදාලව තෝරා ගත් නියැදියට අනුව ප්‍රතිචාරිකයින් අතරින් බහුතරයක් වෘත්තිය පුහුණුව ලබා ගත්තවුන් ස්ත්‍රීන් වූ අතර පුරුෂ පාර්ශවයේ ප්‍රමාණය ස්ත්‍රීන්ට සාපේක්ෂව අඩු බවක් පෙනෙන්නට තිබේ.

පුහුණුලාභින්ගේ අධ්‍යාපන මට්ටමක තරමක් හොඳ තත්වයේ පවතී. ඉහළ ප්‍රතිශතයක් තෘතීයික අධ්‍යාපනය ලැබූ පිරිසක් වීමද විශේෂත්වයකි. සිසුන් පුහුණු පාඨමාලා වලට යොමු වීමට ජනප්‍රියම ක්‍රමය වී ඇත්තේ පසුගිය පාඨමාලාවල මිතුරන් මගින් දැනුවත් වීමයි. එහි ප්‍රතිශතය 32% ඒ අනුව තමන් හදාරණ ලද පාඨමාලාවන් පිළිබඳ හොඳ ආකල්පයක් පාඨමාලාවන් හදාරණ ලද පිරිස් තුළ දක්නට ලැබීම ඉතා වැදගත් කරුණකි.

අවශ්‍ය පුහුණු ආධාරක භාවිතා කිරිම හොඳ මට්ටමක පවතී. සියලු පුහුණු ආධාරක නොවුනද විෂයය කරුණු ඉගැන්වීමට අවශ්‍ය පුහුණු ආධාරක මෙම ආයතන භාවිතා කිරිම ප්‍රශංසනීය වේ. පාඨමාලාවන් පවත්වන මධ්‍යස්ථානවල තත්වය සහ මධ්‍යස්ථානවල සනීපාරක්ෂක පහසුකම් ද හොඳ තත්වයක පවතී.

පුහුණුලාභින් රැකියා ගතවීම පිළිබඳ සලකා බැලීමේදි පුහුණුලාභින්ගෙන් 62% ආසන්න ප්‍රමාණයක් කුමන හෝ ආදායම් උපයන මාර්ගයක නිරතවී ඇත. එය මෙම පාඨමාලාවල සාධණීය තත්වයක් බවට දැක්විය හැක. රැකියාවල නියළී සිටින සිසුන් අතරින් වැඩි ප්‍රතිශතයක් (31% ආසන්න) රු.10000 ත් 15000 අතර මාසික වැටුපක් ලබන රැකියාවක නියළී සිටින අතර රු.15000 ත් රු.30000 අතර වැටුපක් ලබන සිසුන්ගේ ප්‍රතිශතය 25.8% සමස්තයක් වශයෙන් මෙම පුහුණුලාභින්ගෙන් වැඩි පිරිසක් හොඳ මට්ටමක ආදායමක් ලබන බවට නිගමනය කළ හැකිය. එය පහත පරිදි දැක්විය හැකිය.

**මාසිකව ලබන ආදායම**




මූලාශ්‍රය : නියැදි සමීක්ෂණය 2014

සමස්තයක් වශයෙන් ගත් කල්හි මාතර දිස්ත්‍රික්කයේ වෘත්තිය පුහුණු ආයතන ශ්‍රී ලාංකික තරුණ ප්‍රජාවේ වෘත්තිය උන්නතිය උදෙසා දැවැන්ත කාර්යයභාර්යයක් ඉටු කරනු ලබයි. එම ක්‍රියාවලිය තව දුරටත් සංවර්ධනය සඳහා පහත යෝජනා ඉදිරිපත් කළ හැකිය.

පුහුණු කිරිම සහ බඳවා ගැනීම සම්බන්ධ යෝජනා වශයෙන් පහත දැක්වෙන යෝජනා ඉදිරිපත් කළ හැක. පාඨමාලාවන් ප්‍රචාරය කිරිම සඳහා ජනප්‍රියතම මාධ්‍ය බවට පත්ව ඇත්තේ පෙර පාඨමාලාවන් කරන ලද සිසුන් මාර්ගයෙන් දැනුවත් කිරිමයි. එබැවින් දැනට සිටින සිසුන් ඒ සම්බන්ධව දිරිමත් කිරිමේ උපාය මාර්ග වැඩි දියුණු කිරිම කළ හැක. පාඨමාලා පිළිබඳ දැනුවත් කිරිමේදි ජනප්‍රිය මාධ්‍ය මගින් හෝ අන්තර්ජාලය භාවිතා කිරිම වඩාත් සුදුසු වේ. රැකියාවන් අපේක්ෂාවෙන් පාඨමාලාවන් හැදෑරිමට පැමිණෙන පිරිස වැඩි කළ යුතු අතර පාඨමාලාවන් අවසානයේ රැකියාවක් කිරිමට පාඨමාලාව සිදු කරන කාලය තුළ සිසුන් දිරි ගැන්වීම කළ යුතුයි.

මධ්‍යස්ථාන වල තත්වය සහ පහසුකම් සම්බන්ධව අවධානය යොමු කිරීමේදි මධ්‍යස්ථාන වල පහසුකම් ඉතා හොඳ මට්ටමක පවතින අතර මේ තත්වය අඛණ්ඩව පවත්වා ගෙනයාම අවශ්‍ය වේ. ඉගැන්වීම් සඳහා යොදා ගන්නා මාධ්‍ය තුළ විවිධත්වයක් ඇති කළ හැකි නම් ඒ හරහා පුහුණු ලාභින්ගේ ඒකාකාරිත්වය නැති කළ හැක. එසේම වැඩිදුර පුහුණුව සහ රැකියා ගත කිරිම කිරීම, විභාගය ලියා අවසන් වී මාස තුනක් ඇතුළත ස්ථිර සහතිකයක් අනිවාර්යෙන් ලබා දීම, එය ලබා දීමට කල් ගතවේ නම් තාවකාලික සහතිකයක් හෝ හැකි ඉක්මනින් ලබා දීම සිදු කළ හැක. NVQ මට්ටමේ සහතික ලබා ගැනීමට පුහුණුලාභින් දිරි ගැන්වීම සිදු කිරීමද වැදගත්වේ.

වැඩිදුර පුහුණුව සහ රැකියා ගත කිරිම ගත් කල්හි පුහුණු පාඨමාලාවලට අදාල රැකියා ගත පුහුණු කිරිම් වලට පුහුණු ලාභින් යොමු කිරිම කළ හැකි අතර හදාරණ ලද පාඨමාලාවට අදාල ක්ෂේත්‍රයේ රැකියා සඳහා පුහුණුලාභින් යොමු කිරිමට කටයුතු කිරීම, රැකියා සඳහා වැඩි ඉල්ලුමක් ඇති ක්ෂේත්‍ර සඳහා පාඨමාලාවන් වැඩි කිරීම, පවතින පාඨමාලාවන් රැකියා වෙලඳපොළ ඉල්ලුමට ගැලපෙන ලෙස සංශෝධනය කිරීම, ස්වයං රැකියා සඳහා සහ විදේශ රැකියා සඳහා පුහුණුලාභින් යොමු කිරිමට කටයුතු කිරීම අවසාන වශයෙන් රැකියාවලට යොමු කිරිමෙන් පසු එම පුහුණු ලාභියාට මඟ පෙන්වීම සහ පසු විපරම් සිදු කිරිම සිදුකළ යුතු අතර පාඨමාලාවන් අවසානයේ අනිවාර්යෙන් රැකියාවක් කිරිමට පාඨමාලාව සිදු කරන කාලය තුළ සිසුන් දිරි ගැන්වීම කළ යුතු වේ.

මෙම යෝජනා ක්‍රියාත්මක කිරීම තුළින් වෘත්තිය පාඨමාලාවන්වල ගුණාත්මකබව තවත් වර්ධනය කිරීමට හැකිවනු ඇත. එය හොඳ වෘත්තිය අධ්‍යාපනයක් ලත් ශ්‍රම බලකායක් නිර්මාණයවීම කෙරෙහි ඉමහත් පිටිවහලක්වනු ඇත.

## 5.5 ඵලදායී, කාර්යක්ෂම සහ ගුණාත්මක රාජ්‍ය සේවාවක් ගොඩ නැංවීම සඳහා මානව සම්පත් ක්‍රමවේදයක් සංවර්ධනය කිරීම

"නායකත්වය යනු පුද්ගලයෙකුගේ දැක්ම උසස් දෘෂ්ඨියක් කරා ඔසවා දැමීම, පුද්ගලයෙකුගේ කාර්යසාධනය ඉහළ තත්ත්වයකට නංවාලීම සහ සාමාන්‍ය තත්ත්වය ඉක්මවා යන පරිදි පෞරුෂයක් ගොඩ නංවාලීම වේ" (පීටර් ඩ්‍රැකර්)


ශ්‍රී ලංකාව තුළ දැනට පවතින රාජ්‍ය ප්‍රතිපත්තිය තුළ රාජ්‍ය අංශයේ කළමනාකරණ කුසලතාවයන් ගොඩනැංවීම සඳහා යෝග්‍ය ක්‍රමවේදයක් නොමැත. කෙසේවෙතත්, සමහරක් රාජ්‍ය ආයතන සහ අර්ධ රාජ්‍ය ආයතනවල සහාය ඇතිව පෙර පැවති රජයන් විසින් මෙම ගැටළුව විසඳීමට පියවර ගනු ලැබීය. වර්තමානයේ, කළමනාකරණ මට්ටමේ රැකියාවක් සඳහා නිවැරදි පුද්ගලයෙක් බඳවා ගැනීමේදී ඒ සඳහා යම් සුදුසු වැඩපිළිවෙලක් (පොදුවේ පිළිගත් වැඩපිළිවෙලක්) නොමැති අතර, පහළ කළමනාකාර මට්ටමක නිලධාරියෙක් ඉහළ කළමනාකාර මට්ටමකට උසස් කිරීම ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශය තුළ ප්‍රධාන ගැටළුවක් බවට පත් වී ඇත.

ජාතික ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ විෂයපථය යටතේ පවත්නා ශ්‍රී ලංකාවේ ජාතික මානව සම්පත් සංවර්ධන සභාව 2015 ව්‍යාපෘති යෝජනාවක් ලෙස, ශ්‍රී ලංකාව තුළ රාජ්‍ය අංශයෙහි කළමනාකරණ කුසලතා ගොඩ නැංවීම සඳහා මානව සම්පත් ක්‍රමෝපායක් සකස් කර සංවර්ධනය කරමින් සිටී. මෙහි මූලික අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශය තුළ කාර්යක්ෂමතාව, කාර්යසාධනය සහ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම වන අතර එහි ප්‍රධාන අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශය සඳහා පොදුවේ පිළිගත් දක්ෂතාව පදනම් කරගත් වැඩපිළිවෙලක් ගොඩ නැගීමයි.

කොළඹ විශ්ව විද්‍යාලයේ කළමනාකරණ සහ මූල්‍ය පීඨයේ ප්‍රවීනයින් හතර දෙනෙක්, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ (SLIDA) එක් නියෝජිතයෙකුගෙන්, රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ එක් නියෝජිතයෙකුගෙන්, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ එක් නියෝජිතයෙකුගෙන් සහ ආසියානු සංවර්ධන බැංකුවේ (ADB) එක් නියෝජිතයෙකුගෙන් සමන්විත ප්‍රවීනයින්ගේ කමිටුවක් පත්කරනු ලැබ ඇති අතර, මහාචාර්ය ඩබ්.පී.ජී. ද අල්විස් (කොළඹ විශ්ව විද්‍යාලයේ කළමනාකරණ සහ මූල්‍ය පීඨයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය) එම කමිටුවේ සභාපතිවරයා ලෙස පත් කරන ලදී.

සාර්ථක කමිටු රැස්වීම් දෙකක් කළමනාකරණ සහ මූල්‍ය පීඨයේදී පවත්වනු ලැබූ අතර, එම කමිටුවේ ප්‍රවීනයින්ගේ අදහස්වල ප්‍රතිඵලයක් ලෙස කමිටුව විසින් රාජ්‍ය අංශය සඳහා මූලික දක්ෂතා වැඩපිළිවෙලක් සංවර්ධනය කරන ලදී. **2015.10.06** දින පැවති 2වැනි කමිටු රැස්වීමේ යෝජනාවට අනුව, ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයේ මධ්‍යම මට්ටමේ කළමනාකරුවන් සඳහා වැඩමුළුවක් හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි පර්යේෂණ හා පුහුණු ආයතනයේදී (HARTI) **2015.11.03** දින පවත්වන ලදී. රාජ්‍ය අංශයේ විවිධ අංශයන් නියෝජනය කරමින් මධ්‍යම මට්ටමේ කළමනාකරුවන් 41 දෙනෙකු මෙම

වැඩමුළුවට සහභාගී වූහ. එම වැඩමුළුවේ අධ්‍යයන ප්‍රතිඵලවලට අනුව, කළමනාකරණ මට්ටම් 1 රූපයෙහි දැක්වෙන පරිදි වර්ගීකරණය කළ හැකිය.




- ඔබගේ කළමනාකරණ දක්ෂතා වැඩි දියුණු කිරීමට අවශ්‍ය (20 – 46)
- යහපත් කළමනාකරුවෙක් බවට පත්වීමේ මාර්ගයේ සිටින (47 – 73)
- ඔබගේ කණ්ඩායම කළමනාකරණය කරමින් උසස් ආකාරයෙන් කටයුතු කළ ( 74 - 100)

1 රූපය



**2015.11.03** දින HARTI ආයතනයේදී පවත්වන ලද වැඩමුළුව

මෙම වැඩමුළුවේ පරමාර්ථය වූයේ ශ්‍රී ලංකාව තුළ ඵලදායී, කාර්යක්ෂම සහ ගුණාත්මක රාජ්‍ය සේවාවක් සඳහා මූලික දක්ෂතා වැඩපිළිවෙලක් (දක්ෂතා අනුකෘතිය) සංවර්ධනය කිරීම සඳහා රාජ්‍ය අංශයෙහි මධ්‍යම මට්ටමේ කළමනාකරුවන්ගේ දක්ෂතා මට්ටම්වල වර්තමාන තත්ත්වය සහ ඔවුන්ගේ අදහස් සහ යෝජනා හඳුනාගැනීමයි.

මධ්‍යම මට්ටමේ කළමනාකරුවන් 32 දෙදෙනාගේ ප්‍රතිචාරවලින්, කළමනාකරුවන්ගේ බහුතරය (91%ක් පමණ) යහපත් කළමනාකරුවන් බවට පත්ව ඇත. “ඔබගේ කළමනාකරණ දක්ෂතා වැඩි දියුණු කිරීමට අවශ්‍යය” යන කාණ්ඩය කිසිවෙක් නියෝජනය නොකළ අතර 9% දෙනෙක් තමන්ගේ කණ්ඩායම කළමනාකරණය කරමින් උසස් ආකාරයෙන් කටයුතු කොට ඇත. මේ නිසා, වර්තමානයේ ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශය තුළ මධ්‍යම මට්ටමේ කළමනාකරුවන්ගේ බහුතරය කළමනාකරුවෙක් ලෙස උසස් ආකාරයෙන් කටයුතු කරමින් නොසිටි බව අපට පැවසිය හැකිය.

එමනිසා, ලංකාවේ රාජ්‍ය අංශය තුළ කළමනාකරණ දක්ෂතා ගොඩ නැංවීම සඳහා දක්ෂතා වැඩි දියුණු කිරීම අනිවාර්ය කරුණකි. “රාජ්‍ය අංශය තුළ කළමනාකරණ දක්ෂතා ගොඩ නැංවීම සඳහා මානව සම්පත් ක්‍රමෝපායක් සංවර්ධනය කිරීම” පිළිබඳ ව්‍යාපෘතිය ශ්‍රී ලංකාව තුළ නුදුරු අනාගතයේදී ඉහත ගැටළු ආමන්ත්‍රණය කිරීම සඳහා අගනා වත්කමක් මෙන්ම ශ්‍රී ලංකාව තුළ පුරවැසි කේන්ද්‍රගත රාජ්‍ය සේවය පිළිබඳව වර්තමාන රජයේ ජාතික මට්ටමේ පරමාර්ථයක් ද වේ.

## 5.6 සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් ශක්තිමත් කිරීම සහ ප්‍රවර්ධනය කිරීම

ජාතික ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ විෂයපථය යටතේ පවත්නා ශ්‍රී ලංකාවේ ජාතික මානව සම්පත් සංවර්ධන සභාව මගින් (NHRDC) තෝරාගත් දිස්ත්‍රික්කයන් හී පුහුණු වැඩසටහන් පැවැත්වීම තුළින් සුළු හා මධ්‍යම කර්මාන්ත ශක්තිමත් කිරීම අරමුණු කොට ඇත. මෑතකදී, පරිපාලනය, මූල්‍ය කළමනාකරණය, වෙළෙඳ පොළ හඳුනාගැනීම, කළමනාකරණ ගැටළු සහ ක්‍රමෝපායන් සහ ප්‍රතිපත්තිමය වැඩපිළිවෙල (බදු, විගණනය සහ ලියාපදිංචිය) යන ක්ෂේත්‍රයන්හී සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ දක්ෂතා ශක්තිමත් කිරීම අරමුණු කර ගනිමින් පුහුණු වැඩසටහන් තුනක් පොළොන්නරුව, මාතර සහ මහනුවර යන දිස්ත්‍රික්කයන්හී පවත්වන ලදී.





මාතර -සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යවසායකයින්ගේ සහභාගිත්වය

මාතර දිස්ත්‍රික් ලේකම් විසින් සහභාගිවූවන්ට සහතික පත් ප්‍රදානය කිරීම





පොළොන්නරුව - සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ සහභාගිත්වය

නාවලපිටිය ප්‍රා.ලේකම් විසින් සහභාගිවූවන්ට සහතික පත් ප්‍රදානය කිරීම

ඉහත සඳහන් පුහුණු වැඩසටහන සඳහා, පොළොන්නරුවෙන් 86 දෙනෙක්, මාතරින් 94 දෙනෙක් සහ මහනුවර, නාවලපිටිය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයෙන් 70 දෙනක් වශයෙන් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් 250 දෙනෙක් සහභාගි වූහ. මෙම ව්‍යවසායකයින් ප්‍රාදේශිය සහ දිස්ත්‍රික් මට්ටමින් විවිධ ව්‍යාපාරයන්හී නියුක්ත කරනු ලැබූ අතර, කර්මාන්ත ( නිෂ්පාදන : ගඩොල්, වඩුවැඩ, කුළුබඩු නිෂ්පාදන, ඇඳුම් මැසීම, ඉදිකිරීම), සේවාවන් ( කොණ්ඩ කැපීම, ගරාජ, කාර්මික ශිල්පී, කම්මල්කරු වැඩමුළුව,

තොග හා සිල්ලර වෙළෙඳාම, උකස් මධ්‍යස්ථානය, වැල්ඩින්, ජෝතිෂ්‍ය ශාස්ත්‍රය, අවන්හල්, නිවාස හා කාර් අලෙවිය, කාර් කුළියට දීම) සහ කෘෂිකර්මය ( පශු සම්පත්, වගාව, උයන් වැවීම) යන ක්ෂේත්‍රයන්හී සහභාගි කරවන ලදී. ) පුහුණු වැඩසටහන අවසානයේදී, සහභාගිවූවන් වෙත සහතික පත් බෙදා දුන්හ.

**එක් එක් දිස්ත්‍රික්ක වල සහභාගිවූවන් සංඛ්‍යාව**

| දිස්ත්‍රික්කය | දිනය | පිරිමි | ගැහැණු | මුළු ගණන |
|---|---|---|---|---|
| පොළොන්නරුව | 2015.12.15 | 21 | 65 | 86 |
| මාතර | 2015.12.23 | 37 | 57 | 94 |
| මහනුවර, නාවලපිටිය | 2015.12.30 | 20 | 50 | 70 |
| **මුළු ගණන** | | **78** | **172** | **250** |

තම ව්‍යාපාර කරගෙන යාමේදී මූල්‍ය කළමනාකරණය, සේවාවන් සඳහා ප්‍රවේශ වීම, අනෙකුත් ආයතන සමඟ ජාලගතවීම, තමන්ගේ නිෂ්පාදන අලෙවිය සහ ප්‍රවර්ධනය, සහ තාක්ෂණික වර්ධනය සමඟ කුසලතා සංවර්ධනය කර ගැනීම වැනි ගැටළු බොහොමයකට සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් මුහුණ පාති. මෙම පුහුණු වැඩසටහන මගින් මෙවැනි බාධක ජය ගැනීම සඳහා පදනමක් ලබා දී ඇත.

බොහෝ ව්‍යවසායකයින් මුදල් නිසි පරිදි කළමනාකරණය නොකිරීම නිසා අසාර්ථක වේ. මෙය ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාර අසාර්ථකවීම සඳහා හේතු වන ප්‍රධාන ගැටළුවලින් එකකි. ව්‍යාපාරය කාර්යක්ෂමව සහ ඵලදායීව කරගෙන යාම සඳහා මෙම පුහුණුව අප්‍රමාණ වටිනාකමක් එකතු කරන බවට පුහුණුවට සහභාගී වූ බොහෝ ව්‍යවසායකයින් එකඟ වූහ. ව්‍යාපාරයක් ප්‍රවර්ධනය කිරීමේදී, යෝග්‍ය මූල්‍ය පාලනයක්, බදු කළමනාකරණයක් සහ නෛතික ගැටළු පවත්වා ගනිමින් ව්‍යාපාරයක් ප්‍රවර්ධනය කිරීම මෙම වැඩසටහනින් ඉලක්ක කරන ලදී. ඊට අමතරව, වෙළෙඳ පොළ අවස්ථා සහ පුහුණු වැඩසටහන පවත්වා ගැනීමේදී සැලකිය යුතු විවිධ අංශයන්ද මෙහිදී ඉලක්ක කරන ලදී. විශේෂයෙන් මෙම පුහුණු වැඩසටහන තුළින් සහභාගිවූවන් පහත පර්මාර්ථ මුදුන් පත් කරගන්නා ලදී.

1. පරිපාලනය, මූල්‍ය කළමනාකරණය, වෙළෙඳ පොළ හඳුනාගැනීම, කළමනාකරණ ගැටළු, ක්‍රමෝපායන් සහ ප්‍රතිපත්තිමය වැඩපිළිවෙල (බදු, විගණනය සහ ලියාපදිංචිය ) යන ක්ෂේත්‍රයන් හී සංවර්ධනය
2. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ කුසලතා ගොඩ නැංවීම සඳහා දේශිය මට්ටමේ මෙන්ම රාජ්‍ය සහ පුද්ගලික අංශයේ සේවා ආයතන සමඟ ජාලයක් සංවර්ධනය කිරීම (උදා : වාණිජ මණ්ඩලය, දිස්ත්‍රික් සහ ප්‍රාදේශිය මට්ටමේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක නිලධාරීන් සහ අදාළ අනිකුත් පාර්ශවයන්).
3. පුහුණුව, ජාලගතවීම සහ පුද්ගලික අංශයේ සහභාගිත්වය මගින් ව්‍යවසායකත්ව සංස්කෘතිය ගොඩ නැංවීම.

ව්‍යවසායකයින් විසින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක සංවර්ධන පුහුණු වැඩසටහන් පැවැත්වීම වෙනුවෙන් ශ්‍රී ලංකාවේ ජාතික මානව සම්පත් සංවර්ධන සභාව (NHRDC) සහ දිස්ත්‍රික් සහ ප්‍රාදේශිය නිලධාරින් වෙත ඔවුන්ගේ කෘතඥතාව පළකරන ලද අතර ඔවුන්ගේ වෙළෙඳ පොල, ජාලගතවීම සහ අනෙකුත් අදාළ දක්ෂතා සංවර්ධනය කිරීම සඳහා අඛණ්ඩව මෙවැනි වර්ගයේ වැඩසටහන් පවත්වන මෙන් ද ඉල්ලා සිටින ලදී.

## 5.7 සංචාරක කර්මාන්තයේ සහ සත්කාරක සේවාවන්හි පවතින නිපුණතා හිදැස අධ්‍යයනය කිරීම

මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ අනාගතය සඳහා සූදානම් ශ්‍රම බලකායක් යන දැක්ම යටතේ සංචාරක ක්ෂේත්‍රයේ සහ සත්කාරක සේවා හා සම්බන්ධ මානව ප්‍රාග්ධනය සවිබල ගැන්වීම සහ පවතින නිපුණතා හිදැස ආවරණය කිරීම අරමුණු කරගනිමින් පර්යේෂනයක් දියත් කරන ලදී. මේ සඳහා මෙම ක්ෂේත්‍රයේ ප්‍රවීනයන්ගෙන් සමන්විත පහත කමිටු 2ක සුනිල් දිසානායක හා මිත්තපාල යන මහත්වරුන්ගේ සභාපතිත්වය යටතේ පත්කරන ලදී.

- නිපුණතා හා රැකියා විගණිත කමිටුව හා
- යටිතල පහසුකම් සහ නිපුණතා විගණන කමිටුව වේ.

මෙම අධ්‍යයන සංචාරක කර්මාන්තයේ නියැලෙන පුද්ගලයන් හා විශ්ව විද්‍යාලවල ප්‍රවීනයන් සමග ඒකාබද්ධව සිදු කරන ලදී.

මෙම අධ්‍යයනය මගින් 2020 වර්ෂය වනවිට සංචාරකයින්ගේ පැමිණීම මිලියන 4ක් පමණ වන බව පුරෝකථනය කර ඇති අතර දත්ත විශ්ලේෂනයට අනුව සංචාරක ක්ෂේත්‍රයේ රැකියා ජනනය, නව හෝටල් යටිතල පහසුකම්, පහසුකම් බෙදාහැරීම, සහ අවශ්‍ය කරන පුහුණු අවශ්‍යතා හා දීප ව්‍යාප්ත පුහුණු වැඩසටහන් පිළිබඳ කමිටු හරහා දීර්සව සාකච්ජා කරන ලදී.

අධ්‍යයන වාර්තාවට අනුව සංචාරක කර්මාන්තය දියුණු කිරිමට අවශ්‍ය දැනුවත් කිරීමේ වැඩසටහන් දිවයින පුරා පැවැත්වීමට අවශ්‍ය පහසුකම් සැලසීමට පියවර ගෙන ඇති අතර සංචාරක කර්මාන්තයේ නියැලෙන්නන් හා පුහුණු ආයතන සම්බන්ධිකරණය කිරීම හා පහසුකම් සැලසීම සිදු කරනු ඇත.

මහාචාර්ය චන්ද්‍රා ඇඹුල්දෙනිය මහතා විසින් පිළියෙළ කරන ලද ඉදිරි වර්ෂ 2016-2020 දක්වා සංචාරක කර්මාන්තය පිළිබඳ පුරෝකථනය කරන ලද “Tourism Industry Forecasts 2016-2020” වාර්තාව ගරු අගමැති රනිල් වික්‍රමසිංහ මැතිතුමාවෙතත්, සංචාරක හා ක්‍රිස්තියානි ආගමික කටයුතු ඇමති ගරු ජොන් අමරතුංග මැතිතුමා වෙතත් පිළි ගන්වන ලදී.



බණ්ඩාරනායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාවේ පැවැත්වූ සාකච්ඡාව

## 5.8 මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව තුළ ඵලදායිතාව හා තත්ත්වය ඉහළ නැංවීම.

අනාගතය සඳහා සූදානම් ශ්‍රම බලකායක් යන දැක්ම සහිත මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව ශ්‍රී ලංකාවේ මානව සම්පත සංවර්ධනය කිරීම වෙනුවෙන් කාර්යක්ෂම සහ කාර්ය සඵල බවින් යුතු සේවාවක් සඳහා ISO 9001:2008 ජාත්‍යන්තර ප්‍රමිති සහතිකයට අනුකූලව කටයුතු කරන ආයතනයක් වශයෙන් පිදුම් ලබන ලදී.

2015 -11-11 වන දින ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් සිදුකළ විගණනය අනුව අප ආයතනය ISO 9001:2008 තත්ත්ව කළමනාකරණ පද්ධතියට අනුගතව කටයුතු කරන ආයතනයක් වශයෙන් නැවතත් නිර්දේශ කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් හඳුන්වා දෙනු ලබන නව ISO 9001:2015 තත්ත්ව කළමනාකරණ  පද්ධතියට ද අනුකූලව කටයුතු කරමින් ගුණාත්මක සේවාවක් සැපයීමට අපි කැපවී සිටින්නෙමු.

## 6. 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

| | සටහන | 2015 | 2014 | ශ්‍රී.ල.රු. අයවැයගත |
|---|---|---|---|---|
| **වත්කම්** | | | | |
| **ජංගම වත්කම්** | | | | |
| මුදල් හා මුදල් හා සමාන දේ | 1 | 2,323,986.29 | 2,981,759.97 | 347,184.85 |
| ලැබිය යුතු දෑ | 2 | 71,162.82 | 281,607.05 | 71,162.82 |
| භාණ්ඩ ලේඛණ | 3 | 562,194.63 | 447,930.23 | 560,000.00 |
| කලින් ගෙවීම් | 4 | 179,949.64 | 165,183.29 | 180,000.00 |
| අනිකුත් ජංගම වත්කම් | 5 | 2,131,857.17 | 1,516,677.46 | 2,100,000.00 |
| | | **5,269,150.55** | **5,393,158.00** | **3,258,347.67** |
| **ජංගම - නොවන වත්කම්** | | | | |
| යටිතල පහසුකම්, පිරියත සහ උපකරණ | 6 | 6,599,800.71 | 7,266,852.17 | 12,800,000.00 |
| වාහන | 6 | 5,197,328.77 | 7,285,479.45 | 5,200,000.00 |
| අනිකුත් මූල්‍ය නොවන වත්කම් | 6 | 879,571.14 | 730,003.75 | 879,000.00 |
| | | 12,676,700.62 | 15,282,335.37 | 18,879,000.00 |
| **මුළු වත්කම්** | | **17,945,851.17** | **20,675,493.37** | **22,137,347.67** |
| **වගකීම්** | | | | |
| **ජංගම වගකීම්** | | | | |
| ගෙවීම් | 7 | 316,701.07 | 383,959.20 | 300,000.00 |
| කෙටි කාලීන ප්‍රතිපාදන | 8 | 318,242.82 | 237,742.82 | 240,000.00 |
| | | **634,943.89** | **621,702.02** | **540,000.00** |

| | | | | |
|---|---|---|---|---|
| **ජංගම නොවන වගකීම්** | | | | |
| සේවක ප්‍රතිලාභ | 9 | 1,860,905.88 | 1,592,855.75 | 1,860,000.00 |
| | | **1,860,905.88** | **1,592,855.75** | 1,860,000.00 |
| **මුළු වගකීම්** | | **2,495,849.77** | **2,214,557.77** | **2,400,000.00** |
| **ශුද්ධ වත්කම්** | | **15,450,001.40** | **18,460,935.60** | **19,737,347.67** |
| **ශුද්ධ වත්කම්/සම කොටස** | | | | |
| <u>ප්‍රාග්ධන දායකත්වය</u> | | | | |
| දායක ප්‍රාග්ධනය | | 3,000,000.00 | 3,000,000.00 | 3,000,000.00 |
| සංචිත | | 2,063,777.20 | 1,808,200.00 | 3,700,000.00 |
| රාජ්‍ය ප්‍රධාන - ප්‍රාග්ධනය | | 13,148,819.55 | 16,776,387.93 | 17,300,000.00 |
| සමුච්චිත අතිරික්ත/(හිඟ) | | (2,762,595.35) | (3,123,652.33) | (4,262,652.33) |
| **මුළු ශුද්ධ වත්කම්/සම කොටස්** | | **15,450,001.40** | **18,460,935.60** | **19,737,347.67** |

සහකාර අධ්‍යක්ෂ (මූල්‍ය)
දිනය

සභාපති
දිනය:

## 7. මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

**2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් සහ වියදම් ගිණුම**

ශ්‍රී.ල.රු.

| | සටහන | 2015 | 2014 | අයවැයගත |
|---|---|---|---|---|
| **ආදායම** | | | | |
| රාජ්‍ය ප්‍රදාන - පුනරාවර්තන | 10 | 19,830,000.00 | 18,134,114.54 | 21,000,000.00 |
| රාජ්‍ය ප්‍රදාන - ප්‍රාග්ධනය | 11 | 8,866,349.84 | 16,840,222.46 | 19,080,000.00 |
| වෙනත් ප්‍රදාන | 12 | - | 604,764.07 | - |
| වත්කම් අපහරණ ලාභය | 13 | (15,625.68) | 1,346.44 | - |
| අනිකුත් ආදායම් | 14 | 112,813.48 | 279,061.74 | 113,000.00 |
| **මුළු ආදායම** | | **28,793,537.64** | **35,859,509.25** | **40,193,000.00** |
| **වියදම්** | | | | |
| වේතන, වැටුප් සහ සේවක ප්‍රතිලාභ | 15 | 15,622,203.63 | 12,915,337.81 | 15,500,000.00 |
| ප්‍රදාන සහ අනිකුත් නොඉපයූ ගෙවීම් | 16 | 3,939,763.41 | 12,273,441.07 | 13,080,000.00 |
| සැපයුම් සහ භාවිතා කළ පාරිභෝගික භාණ්ඩ | 17 | 674,309.01 | 268,558.17 | 900,000.00 |
| ක්ෂය කිරීම් සහ ක්‍රමක්ෂණ වියදම් | 6 | 5,193,891.31 | 4,927,597.71 | 6,000,000.00 |
| ප්‍රවාහන දීමනා සහ යැපුම් දීමනා | 18 | 147,587.50 | 264,326.50 | 1,500,000.00 |
| උපයෝගීතාව සහ සේවාවන් | 19 | 3,031,239.97 | 2,456,180.57 | 2,890,000.00 |
| නඩත්තු දීමනා | 20 | 1,324,023.91 | 1,285,975.10 | 1,300,000.00 |
| අනිකුත් දීමනා | 21 | 174,647.50 | 280,990.70 | 162,000.00 |
| **මුළු වියදම** | | **30,107,666.24** | **34,672,407.63** | **41,332,000.00** |
| **කාල සීමාව සඳහා අතිරික්තය/(හිඟය)** | | **(1,314,128.60)** | **1,187,101.62** | **(1,139,000.00)** |

## 8. 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා ශුද්ධ වත්කම්/සම කොටස් වල වෙනස්කම් පිළිබඳ ප්‍රකාශනය

ශ්‍රී.ලං.රු.

| | පාලන ආස්ථිතිවල හිමිකරුවන් සඳහා ආරෝපණයන් | | | | |
|---|---|---|---|---|---|
| | දායක ප්‍රාග්ධනය | සංචිත ප්‍රත්‍යාගණනය | රාජ්‍ය ප්‍රදාන - ප්‍රාග්ධනය | සමුච්චිත අතිරික්ත/ හිඟ) | මුළු ශුද්ධ වත්කම/සම කොටස |
| 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය ඉ/ගෙ | 3,000,000.00 | 1,833,030.00 | 17,583,167.18 | (4,335,854.05) | 18,080,343.13 |
| ඉවත් කරන ලද වත්කම් වල ප්‍රත්‍යාගණන අතිරික්තය | - | (24,830.00) | - | 24,830.00 | - |
| ආදායමට මාරු කලා - රජයේ ප්‍රදාන | - | - | - | - | - |
| කාල සීමාව සඳහා ශුද්ධ වත්කම/සම කොටස් හිඟය/අතිරික්තයෙහි සෘජුව හඳුනාගත් ශුද්ධ ආදායම | - | - | 4,108,088.46 | 270.10 | 4,108,358.56 |
| විලම්බිත ආදායම ලා/ලා ගිණුමට මාරු කලා | - | - | (4,914,867.71) | - | (4,914,867.71) |
| කාල සීමාව සඳහා හිඟය | - | - | - | 1,187,101.62 | 1,187,101.62 |
| කාලසීමාව සඳහා හඳුනාගත් මුළු ආදායම සහ වියදම | - | (24,830.00) | (806,779.25) | 1,212,201.72 | 380,592.47 |
| **2014 දෙසැම්බර් 31 දිනට ඉදිරියට ගෙන ගිය ශේෂය** | **3,000,000.00** | **1,808,200.00** | **16,776,387.93** | **(3,123,652.33)** | **18,460,935.60** |
| 2015 ජනවාරි 01 දිනට ඉ/ගෙන ආ ශේෂය | 3,000,000.00 | 1,808,200.00 | 16,776,387.93 | (3,123,652.33) | 18,460,935.60 |
| ඉවත් කරන ලද වත්කම් වල ප්‍රත්‍යාගණන අතිරික්තය | - | - | - | - | - |
| ආදායමට මාරු කලා - රජයේ ප්‍රදාන | - | | (3,882,047.84) | - | (3,882,047.84) |
| කාල සීමාව සඳහා ශුද්ධ වත්කම/සම කොටස් හිඟය/අතිරික්තයෙහි සෘජුව හඳුනාගත් ශුද්ධ ආදායම | - | 1,956,877.20 | 5,238,781.46 | (26,114.42) | 7,169,544.24 |
| පෙර වර්ෂවල ප්‍රත්‍යාගනනය කරන ලද වත්කම් වල ප්‍රත්‍යාගනන ලාභ ඉවත් කිරීම | - | (1,701,300.00) | - | (1,701,300.00) | - |
| විලම්බිත ආදායම ලා/ලා ගිණුමට මාරු කලා | - | - | (4,984,302.00) | - | (4,984,302.00) |
| කාල සීමාව සඳහා අතිරික්තය/හිඟය | - | - | - | (1,314,128.60) | (1,314,128.60) |
| කාල පරිච්ඡේදය සඳහා හඳුනාගත් මුළු ආදායම සහ වියදම | - | 255,577.20 | (3,627,568.38) | 361,056.98 | (3,010,934.20) |
| **2015 දෙසැම්බර් 31 දිනට ඉදිරියට ගෙන ගිය ශේෂය** | **3,000,000.00** | **2,063,777.20** | **13,148,819.55** | **(2,762,595.35)** | **15,450,001.40** |

# 9.මුදල් ප්‍රවාහ ප්‍රකාශය

**2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන වසර සඳහා ඒකාබද්ධ මුල්‍ය ප්‍රවාහ ප්‍රකාශය**

| | **2015** | **2014** |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාවලින්ගෙන් මුල්‍ය ප්‍රවාහයන්** | | |
| අතිරික්තය/(හිඟය) | (1,314,128.60) | 1,187,101.62 |
| <u>**මුල්‍ය - නොවන සංචලනය**</u> | | |
| ක්ෂයකිරීම | 5,193,891.31 | 4,927,597.71 |
| පාරිතෝෂිකය | 268,050.13 | 930,305.50 |
| පූර්ව වර්ෂයේ ගැලපීම | - | - |
| නාමික ක්ෂය කිරීම් ආදායම | (4,984,302.00 | (4,914,867.71) |
| ස්ථාවර වත්කම් මත ප්‍රාග්ධන ප්‍රදාන ලාභ | - | (4,557.75) |
| කාර්ය මණ්ඩල ණය සඳහා පොළිය | (74,331.71) | (57,055.97) |
| විගණන ගාස්තුව | - | 78,160.00 |
| දේපළ, පිරියත සහ උපකරණ මත (ලැබීම්)/අලාභ | 15,625.68 | (1,346.44) |
| පාරිභෝගික ගබඩාවල වැඩිවීම් (අඩුවීම්) | (114,264.40) | (110,224.49) |
| කලින් ගෙවීම් වල වැඩිවීම් (අඩුවීම්) | (14,766.35) | (35,323.29) |
| කාර්ය මණ්ඩල ණය වල වැඩිවීම් (අඩුවීම්) | (621,929.71) | (302,255.79) |
| අනිකුත් අත්තිකාරම් වල වැඩිවීම් (අඩුවීම්) | - | 20,000.00 |
| ගෙවිය යුතු දෑ වල වැඩිවීම් (අඩුවීම්) | (67,258.13) | (1,085,648.17) |
| කෙටි කාලීන ප්‍රතිපාදනවල වැඩිවීම් (අඩුවීම්) | 80,500.00 | - |
| අනිකුත් ජංගම වත්කම්වල ඉහළයාම | 6,750.00 | (9,000.00) |
| ලැබිය යුතු දෑ වල වැඩිවීම | 210,444.23 | (31,045.55) |
| ගෙවන ලද විගණන ගාස්තු | - | (81,580.00) |
| පාරිතෝෂික ගෙවීම් | - | (497,712.75) |
| රාජ්‍ය ප්‍රදාන | 781,952.16 | 4,108,088.46 |
| **මෙහෙයුම් ක්‍රියාවන්ගෙන් ශුද්ධ මුල්‍ය ප්‍රවාහය** | **(633,767.39)** | **4,120,634.98** |

**ආයෝජන ක්‍රියාවලින් මූල්‍ය ප්‍රවාහයන්**

| | | |
|---|---|---|
| ගෘහභාණ්ඩ සහ සවිකිරීම් මිළ දී ගැනීම | - | (139,495.60) |
| කාර්යාල උපකරණ මිළදී ගැනීම | (37,600.00) | (622,261.00) |
| විදුලි උපකරණ මිළදී ගැනීම | - | (13,899.00) |
| පරිගණක මිළ දී ගැනීම | (5,580.00) | (1,204,700.00) |
| වාහන මිළ දී ගැනීම | - | - |
| කාර්ය මණ්ඩල ණය සඳහා පොලිය | 74,331.71 | 57,055,.97 |
| මෘදුකාංග මිළ දී ගැනීම | - | (6,000.00) |
| පොත් මිළ දී ගැනීම | (2,020.00) | (4,250.00) |
| වෙනත් වත්කම් මිළදී ගැනීම | (56,075.00) | (601,339.00) |
| පිරියත සහ උපකරණ අලෙවියෙන් ලබන මුදල් | 2,937.00 | 17,960.00 |
| **ආයෝජන ක්‍රියාවලින් ශුද්ධ මූල්‍ය ප්‍රවාහය** | **(24,006.29)** | **(2,516,928.63)** |

**මූල්‍ය ක්‍රියාවලින් මූල්‍ය ප්‍රවාහයන්**

**මූල්‍ය ක්‍රියාවලින් ශුද්ධ මූල්‍ය ප්‍රවාහයන්**

| | | |
|---|---|---|
| **මුදල් හා මුදල් හා සමාන දේවල ශුද්ධ වැඩිවීම/ (අඩුවීම)** | (657,773.68) | 1,603,706.35 |
| **කාලසීමාව ආරම්භයෙහි මුදල් හා මුදල් වලට සමාන දෑ** | 2,981,759.97 | 1,378,053.62 |
| **කාලසීමාව අවසානයේ දී මුදල් හා මුදල්වලට සමාන දෑ** | **2,323,986.29** | **2,981,759.97** |

**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්**
අතැති මුදල් සහ බැංකුවල ඇති ශේෂය

| | | |
|---|---|---|
| මහජන බැංකුව ගි/අ 119100120409161 | 472,404.47 | 1,001,931.27 |
| ලංකා බැංකුව ගි/අ 165197 | 1,851,581.82 | 1,979,828.70 |
| | **2,323,986.29** | **2,981,759.97** |

## 10.සටහන්

| | | 2015 | 2014 | අයවැයගත |
|---|---|---|---|---|
| <u>මුදල් හා මුදල්වලට සමාන</u> | | | | |
| **දෑ** | **1** | | | |
| මහජන බැංකු ගිණුම් අංක 119100120409161 | | 472,404.47 | 1,001,931.27 | 317,184.85 |
| ලංකා බැංකු ගිණුම-165197 | | 1,851,581.82 | 1,979,828.70 | 30,300.00 |
| | | **2,323,986.29** | **2,981,759.97** | **347,184.85** |
| **<u>ලැබිය යුතු දෑ</u>** | **2** | | | |
| සීමා සහිත ජාතික කඩදාසි සමාගම | | - | 1,770.00 | - |
| ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනය | | - | 208,674.23 | - |
| යෞවන කටයුතු සහ නිපුණතා සංවර්ධන අමාත්‍යංශය. | | - | - | - |
| නිමල් බෝපගේ (හිටපු සභාපති) | | 71,162.82 | 71,162.82 | 71,162.82 |
| | | **71,162.82** | **281,607.05** | **71,162.82** |
| **<u>භාණ්ඩ ලේඛණ</u>** | **3** | | | |
| පාරිභෝගික භාණ්ඩ සංචිත | | 562,194.63 | 447,930.23 | 560,000.00 |
| | | **562,194.63** | **447,930.23** | **560,000.00** |
| **<u>කලින් ගෙවීම්</u>** | **4** | | | |
| වාහන රක්ෂණය | | 149,949.64 | 165,183.29 | 150,000.00 |
| අයකර ගත හැකි ශාලා වෙන් කිරීම් අත්තිකාරම් | | 30,000.00 | - | 30,000.00 |
| | | **179,949.64** | **165,183.29** | **180,000.00** |
| **<u>අනිකුත් ජංගම වත්කම්</u>** | **5** | | | |
| අනිකුත් අත්තිකාරම් | | | - | - |
| කාර්ය මණ්ඩල ණය ආපදා | | 2,120,607.17 | 1,498,677.46 | 2,100,000.00 |
| උත්සව අත්තිකාරම් | | 11,250.00 | 18,000.00 | - |
| | | **2,131,857.17** | **1,516,677.46** | **2,100,000.00** |

# දේපල, පිරියත හා උපකරණ (සටහන 06)

| | ගෘහ භාණ්ඩ හා සවි කිරීම් | | කාර්යාලයීය උපකරණ | | විදුලි උපකරණ | | පරිගණක | | මෘදුකාංග | | වාහන | | පොත් | | අනෙකුත් වත්කම් | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **වාර්තාගත කාල පරිච්ඡේදය 01.01.2015 සිට 31.12.2015** | **2015** | **2014** | **2015** | **2014** | **2015** | **2014** | **2015** | **2014** | **2015** | **2014** | **2015** | **2014** | **2015** | **2014** | **2015** | **2014** |
| ආරම්භක ශේෂය | 1,945,637.94 | 1,818,342.34 | 2,803,429.20 | 2,278,209.95 | 71,555.25 | 57,656.25 | 5,616,658.13 | 4,420,588.13 | 776,556.61 | 770,556.61 | 18,950,000.00 | 18,950,000.00 | 84,347.15 | 80,097.15 | 1,015,204.50 | 413,865.50 |
| එකතු කිරීම් | - | 139,495.60 | 37,600.00 | 622,261.00 | - | 13,899.00 | 5,580.00 | 1,204,700.00 | - | 6,000.00 | 1,500,000.00 | - | 2,020.00 | 4,250.00 | 56,075.00 | 601,339.00 |
| ගැලපීම් | 130,105.27 | 28,010.00 | 59,333.09 | 3,000.00 | (5,420.00) | - | (744,338.90) | - | - | - | - | - | (5.00) | - | 231,680.00 | - |
| ක්ෂය කිරීම් | - | (40,210.00) | (26,779.00) | (99,978.75) | - | - | (12,306.25) | (8,630.00) | - | - | (1,700,000.00) | - | - | - | (24,135.00) | - |
| **අවසාන ශේෂය** | 2,075,743.21 | 1,945,637.94 | 2,873,646.29 | 2,803,492.20 | 66,135.25 | 71,555.25 | 4,865,592.98 | 5,616,658.13 | 776,556.61 | 776,556.61 | 18,750,000.00 | 18,950,000.00 | 86,362.15 | 84,347.15 | 1,278,824.50 | 1,015,204.50 |
| සමුච්චිත ක්ෂය (වර්ෂය ආරම්භය) | 580,607.41 | 396,348.29 | 626,349.80 | 470,306.99 | 27,708.77 | 20,177.65 | 2,507,100.82 | 1,730,043.30 | 205,281.16 | 11,859.13 | 11,664,520.55 | 8,214,520.55 | 74,644.05 | 74,047.75 | 294,903.85 | 242,238.48 |
| ගැලපීම් | 45,444.22 | 25,170.12 | 20,929.14 | - | - | - | 62,883.89 | - | - | - | - | - | - | - | 26,957.17 | - |
| මූල්‍ය කාර්ය සාධන වාර්තාවට අනුව ක්ෂය | 207,574.32 | 187,763.95 | 286,635.82 | 253,002.55 | 4,453.13 | 7,531.12 | 803,311.88 | 782,616.39 | 194,139.15 | 193,422.03 | 3,588,150.68 | 3,450,000.00 | 1,059.96 | 596.30 | 108,566.37 | 52,665.37 |
| අඩු කලා ඉවත්කල වත්කම්වල සමුච්චිත ක්ෂය | - | (28,674.95) | (10,658.69) | (96,959.74) | - | - | (11,962.99) | (5,558.87) | - | - | - | - | - | - | (11,075.89) | - |
| ප්‍රත්‍යාගණනය කල වත්කම් වල සමුච්චිත ක්ෂය | - | - | (1,925.00) | - | (6,099.96) | | (1,483,899.20) | - | - | - | (1,700,000.00) | - | (405.00) | - | (9,035.00) | - |
| **අවසාන ශේෂය** | 833,625.95 | 580,607.41 | 921,331.07 | 626,349.80 | 26,061.90 | 27,708.77 | 1,877,434.40 | 2,507,100.82 | 399,420.31 | 205,281.16 | 13,552,671.23 | 11,664,520.55 | 75,299.01 | 74,644.05 | 410,316.50 | 294,903.85 |
| **ඉදිරියට ගෙන එන ශුද්ධ වටිනාකම** | 1,242,117.26 | 1,365,030.53 | 1,952,315.22 | 2,177,142.40 | 40,073.35 | 43,846.48 | 2,988,158.58 | 3,109,557.31 | 377,136.30 | 571,275.45 | 5,197,328.77 | 7,285,479.45 | 11,063.14 | 9,703.10 | 868,508.00 | 720,300.65 |

| | 2015 | 2014 | අයවැයගත |
|---|---|---|---|
| <u>ගෙවිය යුතු</u> සටහන 7 | | | |
| IWSS සමීක්ෂණය -ගෙවිය යුතු | - | 4,580.57 | - |
| NVQ සහතික ලාභීන් - බෙලිඅත්ත | - | 6,000.00 | - |
| වැටුප් සහ වේතන - NIFNI | - | 63,390.48 | - |
| දුරකථන | 19,961.80 | 11,472.19 | 20,000.00 |
| අන්තර්ජාලය | 13,690.00 | 11,123.58 | 13,000.00 |
| පුවත්පත් බිල්පත් | 3,030.00 | 1820.00 | 3,000.00 |
| පවිත්‍රතා සහ ආරක්ෂක කටයුතු | 125,356.48 | 125,356.47 | 125,356.47 |
| ගෙවිය යුතු දේශීය ගමන් ගාස්තු | - | 6,737.50 | - |
| **ගෙවිය යුතු අනෙකුත් සේවාවන්** | | | |
| තාවකාලික වැටුප් | - | 1,996.80 | - |
| අතිකාල දීමනා | 27,122.00 | 30,396.32 | 22,000.00 |
| නිවාඩු දින ගෙවීම් | 18,880.80 | 36,570.17 | 11,000.00 |
| විදුලිය සහ ජලය | 3,490.75 | 7,440.50 | 3,500.00 |
| කිලිනොච්චි සමීක්ෂණය ගෙවිය යුතු | 53,453.68 | 57,074.62 | 53,453.53 |
| | - | 1,000.00 | - |
| රැකියා අරුණ වෘත්තීය අභිප්‍රේරණ වැඩසටහන ගෙවිය යුතු | 4,325.47 | - | 4,000.00 |
| කුඩා සහ මධ්‍යම පරිමාණ ව්‍යවසාය ශක්‍යතා ගොඩනැගීම පිණිස ව්‍යාපාර මොඩියුලයක් සකස් කිරීමේ ව්‍යාපෘතිය | 32,097.60 | - | 28,000.00 |
| ශ්‍රම වෙළඳපල අධ්‍යයනය ව්‍යාපෘතියේ ගෙවිය යුතු | 18,582.50 | | 13,000.00 |

| | | | | |
|---|---|---|---|---|
| රාජ්‍ය අංශයෙහි නායකත්ව හැකියාව ගොඩනැගීම පිණිස මානව සම්පත් ක්‍රමවේදයක් සකස් කිරීම වැඩසටහන ගෙවිය යුතු | | 3,710.00 | | 3,690.00 |
| | | **316,701.07** | **383,959.20** | **300,000.000** |

| | | | | |
|---|---|---|---|---|
| <u>කෙටි කාලීන ප්‍රතිපාදන</u> | **8** | | | |
| විගණන ගාස්තු - 2013 | | 85,000.00 | 85,000.00 | - |
| විගණන ගාස්තු - 2014 | | 81,580.00 | 81,580.00 | 81,580.00 |
| විගණන ගාස්තු - 2015 | | 80,500.00 | - | 87,257.18 |
| අඩමාන ණය සඳහා වෙන් කිරීම්-නිමල් බෝපගේ | | 71,162.82 | 71,162.82 | 71,162.82 |
| | | **318,242.82** | **237,742.82** | **240,000.00** |

| | | | | |
|---|---|---|---|---|
| <u>සේවක ප්‍රතිලාභ</u> | **9** | | | |
| පාරිතෝෂික ප්‍රතිපාදන | | 1,860,905.88 | 1,592,855.75 | 1,860,000.00 |
| | | **1,860,905.88** | **1,592,855.75** | **1,860,000.00** |

| | සටහන | 2015 | 2014 | අයවැයගත |
|---|---|---|---|---|
| **රාජ්‍ය ප්‍රදාන - පුනරාවර්තන** | 10 | **19,830,000.00** | **18,134,114.54** | **21,000,000.00** |

| | | | | |
|---|---|---|---|---|
| <u>රාජ්‍ය ප්‍රදාන - ප්‍රාග්ධන</u> | 11 | | | |
| රාජ්‍ය ප්‍රදාන - ප්‍රාග්ධන | | 3,882,047.84 | 11,920,797.00 | 13,080,000.00 |
| නාමික ක්ෂය කිරීම් ආදායම | | 4,984,302.00 | 4,914,867.71 | 6,000,000.00 |
| ස්ථාවර වත්කම් මත ප්‍රාග්ධන ප්‍රදාන ලාභ | | - | 4,557.75 | - |
| | | **8,866,349.84** | **16,840,222.46** | **19,080,000.00** |
| <u>**වෙනත් ප්‍රදාන**</u> | | | | |
| ප්‍රදාන - රේඛීය අමාත්‍යාංශයේ | | - | 499,804.07 | - |
| Stromme | 12 | - | 104,960.00 | - |
| | | **-** | **604,764.07** | **-** |
| **වත්කම් අපහරණ ලාභය** | 13 | **(15,625.68)** | **1,346.44** | |
| <u>**අනිකුත් ආදායම**</u> | | | | |
| වෙනත් ආදායම් | 14 | 8,901.20 | 173,908.14 | 8,900.00 |
| ආපදා ණය පොළිය | | 74,331.71 | 57,055.97 | 74,519.43 |
| CADREP | | - | 48,097.63 | - |
| IWSS Survey | | 4,580.57 | - | 4,580.57 |
| NVQ සහතික ලාභීන් - ගාල්ල | | 19,000.00 | - | 19,000.00 |
| NVQ සහතික ලාභීන් - බෙලිඅත්ත | | 6,000.00 | - | 6,000.00 |
| | | **112,813.48** | **279,061.74** | **113,000.00** |

| | | | | |
|---|---|---|---|---|
| **<u>වේතන, වැටුප් සහ සේවක ප්‍රතිලාභ</u>** | 15 | | | |
| වැටුප් සහ වේතන | | 6,349,736.22 | 6,040,218.22 | 6,349,736.22 |
| වැඩබැලීම් වැටුප් | | 41,049.96 | 77,692.80 | 41,049.96 |
| විශේෂ දීමනාව | | 1,140,090.33 | 1,101,577.04 | 1,140,090.33 |
| ජීවන වියදම් දීමනාව | | 2,359,810.32 | 2,387,795.67 | 2,359,810.32 |
| අන්තර් දීමනාව | | 2,644,752.69 | 150,000.00 | 2,644,752.69 |
| ප්‍රවාහන දීමනාව | | 360,000.00 | 166,677.42 | 360,000.00 |
| ඉන්ධන දීමනාව | | 232,850.00 | 340,006.45 | 232,850.00 |
| සේ.අ.සා.අ. | | 1,409,619.21 | 1,096,756.05 | 1,409,619.21 |
| සේ.භා.අ. | | 352,405.12 | 274,189.45 | 352,405.12 |
| අතිකාල | | 91,894.00 | 132,582.86 | 91,894.00 |
| නිවාඩු දින ගෙවීම | | 28,544.25 | 23,388.75 | 28,544.25 |
| තාවකාලික වැටුප් | | 343,401.40 | 194,147.60 | 221,197.77 |
| පාරිතෝෂික වියදම් | | 268,050.13 | 930,305.50 | 268,050.13 |
| | | **15,622,203.63** | **12,915,337.81** | **15,500,000.00** |

| | | | | |
|---|---|---|---|---|
| **<u>ප්‍රධාන සහ අනෙකුත් නොඉපයූ ගෙවීම්</u>** | 16 | | | |
| පුවත්පත් ලිපිය | | 80,928.70 | 169,810.52 | 200,000.00 |
| දැයට කිරුළ ප්‍රදර්ශනය | | - | 762,508.68 | - |
| ශ්‍රම වෙළඳපල අධ්‍යයනය | | 298,004.54 | 4,000,479.50 | 950,000.00 |
| කාර්ය මණ්ඩල පුහුණුව සහ සංවර්ධනය | | 1,218,751.48 | 722,527.18 | 1,420,000.00 |
| මැදපෙරදිග සංක්‍රමණ | | - | 350,794.40 | -<br>660,000.00 |
| මාතර දිස්ත්‍රික් සමීක්ෂණය | | 490,156.72 | 499,804.07 | 400,000.00 |
| වැඩ කාර්යක්ෂමතාවය වර්ධනය සඳහා තාක්ෂණය භාවිතය | | - | 29,437.37 | - |

| | | | |
|---|---|---|---|
| විපතට පත්වූ පවුල් පිළිබඳ සමීක්ෂණය | | 1,455,638.27 | |
| සාකල්‍යතා ප්‍රවේශය අධ්‍යයනය | | 866,720.24 | |
| NHRDC.gov.lk අලෙවිය සහ වර්ධනය | - | 589,650.07 | - |
| කිලිනොච්චි සමීක්ෂණය - PPP ප්‍රවේශය | - | 1,510,095.43 | - |
| ISO සහතික ලබා ගැනීමේ වැඩසටහන | 118,986.47 | 1,144,236.94 | 150,000.00 |
| මෙහෙයුම්කරණය සහ ඇගයීම් ව්‍යාපෘතිය | - | 171,738.40 | - |
| නායකත්ව කණ්ඩායම ගෝලීය මානව සම්පත් පරිචයන්ට නිරාවරනය කිරීමේ ව්‍යාපෘතිය | - | | 4,000,000.00 |
| රාජ්‍ය අංශයෙහි නායකත්ව හැකියාව ගොඩනැගීම පිණිස මානව සම්පත් ක්‍රමවේදයක් සකස් කිරීමේ වැඩසටහන | 162,655.00 | | 570,000.00 |
| රැකියා අරුණ වෘත්තීය අභිප්‍රේරණ වැඩසටහන | 964,655.37 | | 1,070,000.00 |
| තාක්ෂණ අංශය ආවරණය කරමින් කුසලතා අන්තර අධ්‍යයනය ආරම්භ කිරීමේ ව්‍යාපෘතිය | 36,670.75 | | 1,120,000.00 |
| කුඩා සහ මධ්‍යම පරිමාණ ව්‍යවසාය ශක්‍යතා ගොඩනැගීම පිණිස ව්‍යාපාර මොඩියුලයක් සකස් කිරීමේ ව්‍යාපෘතිය | 302,090.53 | | 1,080,000.00 |
| සත්කාරක අංශය ආවරණය කරමින් කුසලතා අන්තර අධ්‍යයනය ආරම්භ කිරීමේ ව්‍යාපෘතිය | 99,321.55 | | 1,160,000.00 |
| දළ දේශීය නිෂ්පාදනයෙන් 1.5% සිට 6% දක්වා අධ්‍යයන අංශය සඳහා වියදම් වෙන් කිරීම වැඩි කිරීම පිණිස රජයේ යෝජනා පිළිබඳ සාකච්ඡා කිරීමට කාර්ය බලකායක් මෙහෙයවීමේ ව්‍යාපෘතිය | 66,357.25 | | 200,000.00 |

| | | | | |
|---|---|---|---|---|
| උසස් පෙළ විභාගයේදී විෂයන් තුනක් සමත් සියල්ලන් සඳහාම උපාධියක් හෝ ඩිප්ලෝමාවක් ලබා ගැනීම පිණිස විධි විධාන සලසා දීමට යෝජනාවක් සකස් කිරීමේ ව්‍යාපෘතිය | | 101,176.05 | | 100,000.00 |
| | | **3,939,763.41** | **12,273,441.07** | **13,080,000.00** |
| **<u>සැපයුම් සහ භාවිතා කළ පාරිභෝගික භාණ්ඩ</u>** | 17 | | | |
| ලිපිද්‍රව්‍ය සහ කාර්යාලීය උපකරණ | | 342,603.01 | 96,838.17 | 335,000.00 |
| ඉන්ධන සහ ලිහිසි ද්‍රව්‍ය | | 331,706.00 | 171,720.00 | 565,000.00 |
| නිල ඇඳුම් | | - | - | - |
| | | **674,309.01** | **268,558.17** | **900,000.00** |
| **ක්ෂයකිරීම් සහ ක්‍රමක්ෂක වියදම්** | 6 | **5,193,891.31** | **4,927,597.71** | **-** |
| **<u>ප්‍රවාහන, යැපුම් සහ දීමනා</u>** | 18 | | | |
| දේශීය ප්‍රවාහනය සහ යැපුම් | | 8,387.50 | 13,526.50 | 10,000.00 |
| විගණන සාමාජිකයින් සඳහා දීමනා | | 78,000.00 | 66,400.00 | 104,000.00 |
| මණ්ඩල සාමාජික දීමනා | | 61,200.00 | 184,400.00 | 1,386,000.00 |
| | | **147,587.50** | **264,326.50** | **1,500,000.00** |
| **උපයෝගිතාව සහ සේවාවන්** | 19 | | | |
| වරිපණම් | | 40,320.00 | 40,320.00 | 40,320.00 |
| විදුලිය | | 662,538.20 | 727,630.33 | 650,000.00 |
| ජලය | | 42,825.32 | 41,320.09 | 60,000.00 |
| දුරකථන ගාස්තු සහ බද්දකුලී | | 231,154.44 | 176,392.67 | 230,000.00 |

| | | | |
|---|---|---|---|
| තැපැල් සහ ටෙලෙක්ස් ගාස්තු | 8,240.00 | 14,425.00 | 20,000.00 |
| පවිත්‍රතා සේවා | 593,927.64 | 386,768.66 | 540,000.00 |
| වෙළඳ දැන්වීම් | 68,931.00 | 37,094.40 | - |
| ආරක්ෂක සේවාව | 910,349.50 | 804,750.00 | 682,000.00 |
| අන්තර්ජාලය | 142,621.40 | 104,680.42 | 140,000.00 |
| උපදේශනය | - | 10,500.00 | - |
| අනිකුත් උපයෝජතාව සහ අනෙකුත් සේවාවන් | 330,332.47 | 112,299.00 | 527,680.00 |
| | **3,031,239.97** | **2,456,180.57** | **2,890,000.00** |

**නඩත්තු වියදම්** 20

| | | | |
|---|---|---|---|
| ගොඩනැගිලි සහ ආකෘති අලුත්වැඩියාව සහ නඩත්තුව | 39,037.00 | - | 40,000.00 |
| පිරියත උපකරණ අලුත්වැඩියාව සහ නඩත්තුව | - | 181,611.90 | - |
| වාහන අලුත්වැඩියාව සහ නඩත්තුව | 386,873.49 | 739,786.70 | 400,000.00 |
| වාහන රක්ෂණය | 358,770.10 | 307,844.00 | 400,000.00 |
| කාර්යාලීය උපකරණ අලුත්වැඩියාව සහ නඩත්තුව | 167,535.40 | 53,552.50 | 125,000.00 |
| පරිගණක අලුත්වැඩියාව සහ නඩත්තුව | 43,825.50 | - | 50,000.00 |
| වෙනත් වත්කම් අලුත්වැඩියාව සහ නඩත්තුව | 327,982.42 | 3,180.00 | 285,000.00 |
| | **1,324,023.91** | **1,285,975.10** | **1,300,000.00** |

**අනෙකුත් වියදම්** 21

| | | | |
|---|---|---|---|
| විගණන විමසුම | - | 78,160.00 | 85,000.00 |
| පුවත්පත | 68,825.00 | 16,940.00 | 9,000.00 |
| කාර්ය මණ්ඩල සුහසාධනය | 30,375.00 | 11,750.00 | 28,000.00 |
| වෛද්‍ය සේවා | 3,546.00 | 4,999.00 | 5,000.00 |
| අනෙකුත් සේවා වියදම් | - | 76,217.70 | - |
| සංග්‍රහ කටයුතු | 50,631.50 | 92,924.00 | 35,000.00 |
| පුස්තකාල සේවා | 19,500.00 | - | - |
| ජාතික කඩදාසි සංස්ථාව | 1,770.00 | - | - |
| | **174,647.50** | **280,990.70** | **162,000.00** |

## 11.වැදගත් ගිණුම්කරන ප්‍රතිපත්තීන් සහ අනිකුත් පැහැදිලි කිරීම් වල සාරාංශයකින් සමන්විත සටහන්

**1.** 1997 අංක 18 දරන පනත යටතේ ශ්‍රී ලංකා මානව සම්පත් සංවර්ධනය කිරීමේ ජාතික සභාව ස්ථාපනය කරනලදී. ආයතනයට පැවරී ඇති බලතල යටතේ එය මානව සම්පත් සංවර්ධනයට අදාළ සියලුම ක්‍රියාවන් සඳහා ප්‍රමුඛත්වය දෙන අතර මානව සම්පත් සංවර්ධනය සඳහා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරයි.

**2. මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා ගිණුම් ඉදිරිපත්කිරීම සහ අවසරදීම**

(1971 අංක 38) දරන මුදල් පනතේ අංක 14 වගන්තියට අනුව, ශ්‍රී ලංකා මානව සම්පත් සංවර්ධනය කිරීමේ ජාතික සභාව රාජ්‍ය සංස්ථාවක් ලෙස වර්ෂය තුළ එහි බලතල, කාර්යභාරයන් සහ රාජකාරි ක්‍රියාවේ යෙදවීම, ඉටුකිරීම සහ සිදුකිරීම මෙන්ම ප්‍රතිපත්ති සහ වැඩසටහන් ක්‍රියාවට නැංවීම පිළිබඳ එහි සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේදීම වාර්ෂික වාර්තාවක කෙටුම්පතක් පිළියෙල කරනු ලබයි. වර්ෂය තුළදී අදාළ අමාත්‍යවරයා විසින් සංස්ථාවට ලබාදුන් ඕනෑම නියෝගයක් එවැනි වාර්තාවක දක්වනු ලබයි. එවැනි වාර්තාවක පිටපත් සෑම වසරක් අවසානයේදීම මාස හතරක් ඇතුළත අදාළ අමාත්‍යවරයාට, සහ මුදල් අමාත්‍යවරයාට (ඔහු අදාළ අමාත්‍යවරයා නොවන්නේ නම්), ක්‍රම සම්පාදන අමාත්‍යවරයාට සහ විගණකාධිපතිවරයාට ඉදිරිපත් කරනු ලබයි.

1971 අංක 38 දරණ මුදල් පනතේ අංක 14 වගන්තියට අනුව, සියලුම මූල්‍ය වර්ෂයක් සඳහා වන රාජ්‍ය සංස්ථාවකම ගිණුම්, ගිණුම් සම්බන්ධ වෙනත් යම් වාර්තා ද සමඟින් එකී වර්ෂය සමාප්ත වීමෙන් පසු සිව් මසක් ඇතුලත විගණකාධිපතිවරයා විසින් නිශ්චිතව දක්වා සිටින ආකාරයෙන් විගණනය සඳහා ඔහු වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය. මෙකී උප වගන්තියේ පූර්වගාමී විධිවිධානවලට පටහැනිවන හෝ ඒ හා අනුකූලවීමට අපොහොසත්වන එවන් ඕනෑම සංස්ථාවක් මෙම පනත යටතේ වරදකරුවෙක් වන අතර, මහේස්ත්‍රාත්වරයෙක් ඉදිරියේ පවත්වනු ලබන ලඝු සමේක්ෂණයකින් අනතුරුව රුපියල් දහස ඉක්මවා නොයන දණ්ඩනයකට යටත් වනු ඇත.

**3. අනුකූලතා ප්‍රකාශනය**

ශ්‍රී ලංකා මානව සම්පත් සංවර්ධනය කිරීමේ ජාතික සභාවේ ගිණුම්කරන සාම්ප්‍රදාය ශ්‍රී ලංකා වරලත් ගනකාධිකාරි ආයතනය මඟින් ප්‍රකාශයට පත්කරනු ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන් හා අනුකූල වේ.

## 4. මිණුම් පදනම

යම් යම් ගෘහ භාණ්ඩ සහ සවිකිරීම්, කාර්යාලීය උපකරණ, විද්‍යුත් සවිකිරීම් සහ උපකරණ, පරිගණක, වාහන සහ අනෙකුත් වත්කම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා තක්සේරු දෙපාර්තමේන්තුව විසින් 2008 සහ 2011 යන වසරවල සිදුකරන ලද ප්‍රත්‍යාගණනයන් හැර, සභාවේ මූල්‍ය ප්‍රකාශන සකස් කරනු ලබයි.

## 5. වත්කම් ආගණනයේ පදනම

**5.1** දේපල, පිරියත සහ උපකරණ වල අගය සඳහන් කරනු ලබන්නේ පිරිවැය/ආගණන වටිනාකමින් සමුච්චිත ක්ෂයකිරීම් අඩුකළ පසු ලැබෙන අගයයි.

**5.2** සියලුම දේපල, පිරියත සහ උපකරණ සම්බන්ධයෙන් ක්ෂයකිරීම ඇස්තමේන්තුගත සඵල ආයුකාලයට අදාළව පිරිවැය කපා හැරීම සඳහා ආරෝපණය කරනු ලබයි.

**5.3** මිළදී ගත් වර්ෂය සඳහා ක්ෂය කිරීම් සිදු නොකරන අතර, 2009 වසරට පෙර මිළදී ගත් වත්කම් සම්බන්ධයෙන් අපහරණ වසරේදී පූර්ණ ක්ෂය කිරීම සිදුකරන අතර, 2009 වසරේ සිට ක්ෂය කිරීම් ගණනය කර ඇත්තේ සෑම වත්කමකම මිළදී ගත් දිනය/අපහරණ දිනය පදනම් කොට ගෙනය.

**5.4** පාරිභෝගික භාණ්ඩ ගබඩා මණිනු ලබන්නේ පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි කළ හැකි වටිනාකම යන දෙකින් අඩු අගයකටය.

## 6. ක්ෂය කිරීම

වත්කම් පන්තීන් සහ ක්ෂය කිරීම් අනුපාතිකයන් පහත පරිදි වේ. වත්කම් පන්තීන් තීරණය කරනු ලබන්නේ ආස්ථිතියෙහි ඒවායේ ස්වභාවය සහ භාවිතයට අනුවය.

| | |
|---|---|
| ගොඩනැගිලි සහ ව්‍යුහයන් | 2.5% |
| ගෘහභාණ්ඩ සහ සවිකිරීම් | 10% |
| කාර්යාලීය උපකරණ | 10% |
| විද්‍යුත් සවිකිරීම් සහ උපකරණ | 20% |
| පරිගණක | 20% |
| පරිගණක මෘදුකාංග | 25% |
| වාහන | 20% |
| පොත් | 10% |
| අනිකුත් වත්කම් | 10% |

**7. සන්සන්දනාත්මක සංඛ්‍යා**

පසුගිය මූල්‍ය වර්ෂයේ සංඛ්‍යා ප්‍රති වර්ගීකරණය කර මූල්‍ය ප්‍රකාශනවල තුලනාත්මක බව ඇති කිරීම පිණිස අනුකූලනය කර තිබේ.

**8. වාර්තාකරන දිනෙන් පසු සිදුවීම්**

සියලුම භෞතික ශේෂපත්‍ර සිදුවීම් සැලකිල්ලට ගෙන ඒ සඳහා යෝග්‍ය අනුකූලනයන් සිදුකිරීම හෝ මූල්‍ය ප්‍රකාශනවල අනාවරණයන් සිදුකර ඇත.

**9.** ශ්‍රී ලංකා මානව සම්පත් සංවර්ධනය කිරීමේ ජාතික සභාවේ ක්‍රියාවන් අඛණ්ඩව සිදුකිරීම

අගෝස්තු අංක 2 දරණ සභාවෙහි නිර්දේශය පරිදි " රැකියා පිරි සැකසුම සම්බන්ධ වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම". සම්බන්ධ ශ්‍රී ලංකා මානව සම්පත් සංවර්ධනය කිරීමේ ජාතික සභාව ක්‍රියාව අත්හිටුවන ලදී. ඉහත ක්‍රියාවලීන් සඳහා වෙන්කරන ලද ශේෂ ප්‍රාග්ධන වියදම 2013 සංශෝධිත අයවැය හරහා අනිකුත් කාර්යයන්ට නැවත වෙන් කරන ලදී.

**10. රාජ්‍ය ප්‍රදාන සම්බන්ධ ගිණුම්කරණය**

මහා භාණ්ඩාගාරයෙන් ලැබුනු පුනරාවර්තන ප්‍රදාන සහ ප්‍රාග්ධන ප්‍රධාන පිළිවෙලින් ශ්‍රී ලංකා මානව සම්පත් සංවර්ධනය කිරීමේ ජාතික සභාවෙහි පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම් සපුරාලීම පිණිස යොදා ගන්නා ලදී. ශ්‍රී ලංකා මානව සම්පත් සංවර්ධනය කිරීමේ ජාතික සභාවෙහි කාර්යයන් සම්බන්ධයෙන් දරණ ලද මුදල් වසර තුළ අයකරන ලද ක්ෂය කිරීමට සමාන මුදලක් ප්‍රාග්ධන වත්කම්හි සඵල ආයුකාලය පුරා ක්‍රමානුකූල පදනමින් ආදායමක් ලෙස හඳුනාගනු ලබයි.

**11. විශ්‍රාම ගැන්වීම් ප්‍රතිලාභ පිරිවැය**

**11.1 අර්ථ දක්වන ලද දායකත්ව සැලැස්ම– සේ.අ.අ සහ සේ. භා.අ**

සේවක අර්ථසාධක අරමුදලෙහි දායකත්වයට සහ සේවක භාරකාර අරමුදලෙහි දායකත්වයට සුදුසුකම් ලබන සියලුම සේවකයින් ප්‍රතිග්‍රාහී ව්‍යවස්ථා සහ රෙගුලාසි යටතේ අදාළ දායක අරමුදල් මඟින් ආවරණය කරනු ලබයි.

## 11.2 විශ්‍රාමික පාරිතෝෂික


අංක 19 දරන LKAS “ සේවක ප්‍රතිලාභ” වලට අනුකූලව, 1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීම් පනත යටතේ ගෙවීමට නියමිත විශ්‍රාමික පාරිතෝෂික සඳහා මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන වෙන් කරනු ලබයි. විශ්‍රාමික බැරකම් සඳහා බාහිර වශයෙන් අරමුදල් සැපයීම හෝ ආයුගණක වශයෙන් ඇගයීම සිදුකරනු නොලබයි.


## 12. මූල්‍ය කාර්යසාධනය

සභාවෙහි මෙහෙයවීම් සහ එහි ප්‍රාග්ධන වත්කම් නඩත්තු කිරීම සඳහා දරනු ලබන සියලුම පිරිවැය සම්බන්ධයෙන් එය කාර්යක්ෂමව කටයුතු කර ඇති අතර ආදායම සඳහා අයකරනු ලැබ ඇත. ආදායම් වියදමෙහි හිඟය/අතිරික්තය කරා ළඟා වී ඇත්තේ සියලුම දැනුවත් වගකීම් සහ වත්කම් ක්ෂය කිරීම පිණිස ප්‍රතිපාදන සැපයීමෙන් පසුවය.

## 13. මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය

අංක 2 දරණ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන් වල 27 වන වගන්තිය මඟින් නිශ්චිතව දක්වා ඇති වක්‍ර ක්‍රමය යොදා ගනිමින් මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කරනු ලබයි.



## 12. 2015 වර්ෂයට අදාල විගණකාධිපති වාර්තාව

# විගණකාධිපති දෙපාර්තමේන්තුව
## கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
## AUDITOR GENERAL'S DEPARTMENT

| | | | |
|---|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | වීටීවයි/ඊ/එන්එච්ආර්ඩීසී/ 1/15/80 | ඔබේ අංකය / உமது இல. / Your No. | |
| දිනය / திகதி / Date | 2016 දෙසැම්බර් 24 දින | | |

සභාපති

මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව.

මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

---

මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1997 අංක 18 දරන මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව පනතේ 24 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාරව සභාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ13(7)ඒ වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් සභාවේ සභාපති වෙත 2016 දෙසැම්බර් 07 දින නිකුත් කරන ලදි.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.



අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. [illegible] No. 306/72, [illegible]

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂයපථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.
මගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම

2.3 ලැබිය යුතු ගිණුම්

2012 වර්ෂයේ සිට හිටපු සභාපතිවරයාගෙන් සභාවට අයවිය යුතු මුදල් සහ ආපසු භාර නොදුන් ඉන්වෙන්ට්‍රි භාණ්ඩවල වටිනාකම වූ රු.71,162 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකරගෙන නොතිබුණි. මෙයින් රු.31,050 ක්වූ මුදල් අයකර ගැනීම සඳහා කොළඹ දිසා අධිකරණයේ නඩුවක් පවරා තිබුණි.

2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම.

නීති රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 110 වගන්තිය | හානි හා පාඩු සම්බන්ධයෙන් ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ආ) | 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සෑම මාස 06 කට වරක්ම වාහනවල ඉන්ධන දැවීම පිළිබඳව පරීක්ෂාකළ යුතු වුවත්, සියළුම වාහන සම්බන්ධයෙන් පරීක්ෂාවන් සිදුකර නොතිබුණි. |

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.1,314,129 ක ඌණතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.1,187,102 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.2,501,231 ක පිරිහීමක් ඇති වී තිබුණි. ප්‍රදාන හා අනෙකුත් මාරු ගෙවීම් රු.8,333,678 කින් අඩු වුවද සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා වියදම් සඳහා භාණ්ඩාගාර ලැබීම් රු.7,973,872 ක් අඩුවීම, වැටුප් හා වේතන රු. 2,706,865 කින් වැඩිවීම ඉහත පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 හා 2014 වර්ෂවල මූල්‍ය අතිරික්තයක් ද අනෙකුත් වර්ෂවල මූල්‍ය ඌනතාවයක් ද පෙන්නුම් කෙරුණි. සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් සැලකිල්ලට ගැනීමේදී ආයතනයේ දායකත්වය 2011 වර්ෂයේ සිට 2015 වර්ෂය වනවිට රු. 3,446,541 ක සිට රු. 19,501,966 දක්වා අඛණ්ඩ වැඩිවීමක් පෙන්නුම් කෙරුණි.

4. මෙහෙයුම් සමාලෝචනය
-----------------------------

4.1 කාර්යසාධනය
------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

1997 අංක 18 දරන මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව පනතෙහි 14(1) ඡේදය පරිදි රැකීරක්ෂා, පුහුණුව සහ අධ්‍යාපනය, විද්‍යාව සහ තාක්ෂණය උපයෝගී කර ගැනීම, ජීවන තත්ත්වය නංවාලීම, අවාසිකර තැනැත්තන්ගේ කණ්ඩායම් සඳහා සමාජ ආරක්ෂාව සැලසුම් කිරීම ඇතුළු ජාතික මානව සම්පත් ප්‍රතිපත්තියේ සියලු අංශ පිළිබඳ සොයා බලා එම ප්‍රතිපත්ති කලින් කළ සමාලෝචනය කිරීම, එම වැඩසටහන් ක්‍රියාත්මක වීම සොයා බැලීම මූලික අරමුණු වේ.

ඉහත අරමුණු ඉටුකර ගැනීම සම්බන්ධ පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ජාතික මානව සම්පත් ප්‍රතිපත්ති සඳහා විද්‍යාව සහ තාක්ෂණය උපයෝගී කර ගැනීම හා අවාසිකර කණ්ඩායම් සඳහා සමාජ ආරක්ෂාව සැලසුම් කිරීම සහ ආණ්ඩුව විසින් අනුමත කරන ලද මානව සම්පත් සංවර්ධන සැලසුම් සහ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සොයා බැලීම යන අරමුණු ඉටුකර ගැනීම සඳහා සභාව විසින් සමාලෝචිත වර්ෂය තුළදී වැඩ සටහන් සකස්කර නොතිබුණි.

කෙසේ වුවද ජාතික මානව සම්පත් ප්‍රතිපත්තිය සමාලෝචනය කිරීමේ කාර්යය කම්කරු අමාත්‍යාංශය හා එකතුව සිදුකිරීමට ආර්ථික කටයුතු පිළිබඳ කැබිනට් අනුකාරක සභාව මගින් පවරා තිබූ අතර ඒ අනුව නිරීක්ෂණ මට්ටමින් එම අමාත්‍යාංශය සමඟ සම්බන්ධව කාර්යයෙහි නිරත වන බව සභාපතිවරයාගේ පිළිතුරු මගින් මා වෙත දන්වා තිබුණි.

(ආ) 2015 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව කාර්යසාධනය පරීක්ෂාවේදී පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) වර්ෂය තුළදී ව්‍යාපෘති 3 ක් අවසන් කර අමාත්‍යවරයා වෙත වාර්තා ඉදිරිපත් කළ බව වාර්තා කර තිබුණද ඉදිරිපත් කළ ලිපි හා දින පිළිබඳ සාක්ෂි ඉදිරිපත් නොවුණි. පිළිතුර අනුව සභාපතිවරයා අග්‍රාමාත්‍යවරයාගේ උපදේශකවරයකු ලෙස කටයුතු කරන නිසා අදාල වාර්තා පෞද්ගලිකවම අදාල අමාත්‍යවරයා වූ අගමැතිවරයා වෙත භාරදී තිබුණි.

(ii) වර්ෂය තුළ සම්පූර්ණ කිරීමට යෝජිත වූ පර්යේෂණ ව්‍යාපෘති 06 ක භෞතික කාර්යසාධනය සියයට 60 සිට සියයට 90 දක්වා විය.

(iii) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ කාර්යයන් සඳහා වෙන් කර තිබූ ප්‍රතිපාදනවලින් වැය කර තිබුනේ සියයට 37 ක් හෙවත් රු. 2,521,137 ක් පමණි. වර්ෂය තුළ සම්පූර්ණ කළ රැකියා දශ ලක්ෂයේ වැඩ සටහන සඳහා ප්‍රතිපත්ති ප්‍රකාශයක් සකස් කිරීම සඳහා වූ ව්‍යාපෘතිය සඳහා කිසිදු වියදමක් දරා නොතිබූ අතර සම්පත්දායකයින් ස්වේච්ඡාවෙන් දායකවූවන් වන නිසා පිරිවැය අවම වන බව සභාපතිවරයා විසින් පිළිතුරු මඟින් දන්වා තිබුණි.

4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1997 අංක 18 දරන මානව සම්පත් සංවර්ධනය කිරීමේ ජාතික සභාව පනතේ 3 වන වගන්තිය අනුව සභාවේ සාමාජිකයන් මුදල්, අධ්‍යාපන, කම්කරු, තරුණසේවා, විද්‍යාව හා තාක්ෂණ, කෘෂිකර්ම හා සෞඛ්‍ය ආදී ප්‍රධාන අමාත්‍යාංශ 11 ක ලේකම්වරු හා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති, ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරියේ සභාපති ඇතුළු වෘත්තීය අධ්‍යාපන ආයතන 4 ක සභාපතිවරු සහ අමාත්‍යවරයා විසින් පත්කරන ක්ෂේත්‍රයේ ඉහළ පලපුරුද්ද ඇති නිලධාරීන් පස්දෙනෙක් ඇතුළත් සාමාජිකයන් 20 දෙනෙකුගෙන් සමන්විතවේ.

වර්ෂයක් සඳහා රැස්වීම් 12 ක් පැවැත්විය යුතු වුවත් 2015 වර්ෂය සඳහා රැස්වීම් 02 ක් පමණක් පවත්වා තිබූ අතර එම රැස්වීම් වලදී ද ආයතනයේ අරමුණු ඉටුකිරීම සහ කාර්යසාධනය හා සම්බන්ධ යෝජනා ඉදිරිපත් කර නොතිබූ බවත් එබඳු තීරණ කිසිවක් ගෙන නොතිබූ බවත් නිරීක්ෂණය විය.

(ආ) වර්ෂය තුළ අවසන් කර අමාත්‍යවරයා වෙත භාරදී තිබූ රැකියා දශලක්ෂයක් නිර්මාණය කිරීම සඳහා වූ ප්‍රතිපත්ති ප්‍රකාශය සකස් කිරීම, අ:පො:ස(උසස් පෙළ) විෂයයන් තුනක් සමත් සියලු සිසුන් සඳහා උපාධියක් හෝ ඩිප්ලෝමා සහතිකයක් ලබාදීම සඳහා වූ යෝජනාවලියක් සැකසීම හා දළ ජාතික නිෂ්පාදිතයෙන් අධ්‍යාපනය සඳහා වන වියදම සියයට 1.5 සිට සියයට 6 දක්වා වැඩි කිරීම සඳහා වූ රජයේ යෝජනාව සාකච්ඡා කිරීම යන පර්යේෂණ වාර්තා සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ පවත්වන ලද පාලක සභා රැස්වීම් 02 හි පත්කර තිබූ සාමාජිකයන් 19 දෙනෙකු අතරින් එක් වරක් හෝ සහභාගී නොවූ සාමාජිකයින් සංඛ්‍යාව 05 ක් ද එක් රැස්වීම් වාරයකට පමණක් සහභාගී වූ සාමාජික සංඛ්‍යාව 07 ක් ද බව නිරීක්ෂණය විය.
සාමාජිකයන් කාර්ය බහුල වීම නිසා රැස්වීම් සඳහා සහභාගී වීම අපහසු බව ද මේ සඳහා පිළියමක් ලෙස පනත සංශෝධනය කිරීම සඳහා කටයුතු සම්පාදනය කරමින් පැවැතුනද සභාවේ ආයතනික ව්‍යුහය වෙනස් කරමින් පවතින නිසා එය තාවකාලිකව අත්හිටුවා ඇති බවද සභාපතිවරයාගේ පිළිතුරු මඟින් දන්වා තිබුණි.

(ඈ) පර්යේෂණ සමාලෝචනය හා මහපෙන්වීම සඳහා කමිටුවක් (Steering committee) පත්කර නොතිබුණි.

4.3 ආර්ථික නොවන ගණුදෙනු

2015 වර්ෂයේ රැකියා අරුණ වැඩසටහන් 02 ක් සඳහා ඇස්තමේන්තු කළ පුද්ගලයන් 3000 න් 1759 ක් නොපැමිනීම නිසා මෙම වැඩසටහන යටතේ ආහාරපාන සඳහා රු. 208,674 ක් අනාර්ථික ලෙස වැය කර තිබුණි.

5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

5.1 අභ්‍යන්තර විගණනය

2011 දෙසැම්බර් 23 දිනැති අංක ඩීඑම්ඒ/06 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය පරිදි ආයතනයේ කටයුතු කාර්යක්ෂමව හා ඵලදායීව සහ ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන ක්‍රම ක්‍රියාවේ යොදවන බවට තහවුරුකර ගැනීම සඳහා අභ්‍යන්තර විගණන ඒකකයක් ක්‍රියාත්මක කර නොතිබුණි.

5.2 අයවැය ලේඛනමය පාලනය

--------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ගත ආදායම් සහ වියදම් තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී සියයට 20 සිට සියයට 3555 දක්වා විචලනයන් වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

6 පද්ධති හා පාලනයන්

------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සභාවේ සභාපතිවරයාගේ අවධානයට යොමුකරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළයුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) අරමුණු ඉටුකිරීම | පනතේ සඳහන් සියළු අරමුණු ප්‍රමාණවත් පරිදි ඉටුකර ගැනීම සඳහා වැඩ සටහන් සකස් කර අරමුදල් වෙන්කර ගැනීම කෙරෙහි අවධානය යොමු නොකිරීම හා ක්‍රියාකාරි සැලැස්ම පරිදි ඉලක්ක ඉටුකර ගැනීමට ක්‍රියා නොකිරීම. |
| (ආ) ලිපිද්‍රව්‍ය තොග පාලනය | ලිපිද්‍රව්‍ය තොගයට ගැනීමේදී, ද්‍රව්‍ය ලැබීම් නිවේදන හා නිකුත් කිරීමේදී ද්‍රව්‍ය නිකුත් කිරීමේ නියෝග භාවිතා කර විධිමත් අධීක්ෂණයක් යටතේ ලිපිද්‍රව්‍ය තොග පාලනයට ක්‍රියා නොකිරීම |

එච්. එම් ගාමිණී විජේසිංහ
විගණකාධිපති

## 13. 2015 වර්ෂයට අදාල විගණකාධිපති වාර්තාවේ පිළිතුරු

මගේ අංක: 3/2/12/1 2016 දෙසැම්බර් 30 දින

විගණකාධිපති
විගණකාධිපති දෙපාර්තමේන්තුව
බත්තරමුල්ල

**<u>මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරණ මුදල් පනතේ 14(2) සී වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබේ අංක VTY/NHRDC/1/15/80 හා 2016.12.30 දිනැති විගණකාධිපති වාර්තාව හා බැඳේ.

**2.3 ලැබිය යුතු ගිණුම්**

ආපසු භාර නොදුන් ඉන්වෙන්ට්‍රි භාණ්ඩ නැවත ලබා ගැනීම හිටපු සභාපතිවරයාගෙන් රු. 31,050.00 ක මුදල අය කර ගැනීම සඳහා කොළඹ දිසා අධිකරණයේ ගොනු කර ඇති නඩුව 2017.05.21 වන දින විභාග කිරීමට නියමිතය.

**2.4 නීති රීති රෙගුලාසි වලට අනුකූල නොවීම**

(අ) එකඟ වේ. හානි හා පාඩු සම්බන්ධයෙන් ලේඛණයක් 2016 වසරේ සිට පවත්වාගෙන යාමට අවශ්‍යකටයුතු සකස් කර ඇත.

(ආ) මාස 6 කට වරක් වාහනවල ඉන්ධන දැවීම පිළිබඳ පරීක්ෂාව සියළුම වාහන සම්බන්ධයෙන් සිදු කරමින් අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

එකඟ වෙමි.

2013 වර්ෂයට සාපේක්ෂව 2014 වර්ෂයේ වැඩිවීමට හේතුව නව බඳවා ගැනීම්, සේවක වැටුප් ඉහල යාම හා නව මිලදී ගැනීම් වේ.

**4.1 කාර්ය සාධනය**

(ආ) (i)එකඟ වෙමි.

ඉදිරි වසරේ සිට අදාළ වර්ෂය සඳහා පිළියෙල කරන ලද ව්‍යාපෘති වාර්තා අදාළ අමාත්‍යවරයා වෙත ලිඛිතව භාර දීමට කටයුතු කරමි.

(ii) එකඟ වෙමි.

(iii) එකඟ වෙමි.

**4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්**

(අ) 2015 වසරේ ජනවාරි සහ අගෝස්තු යන මාස වල සිදු වූ රජය වෙනස් වීමත් සමග නව පාලක මණ්ඩල සාමාජිකයින් එකම වර්ෂය තුල දෙවරක් නැවත පත් කරන ලදී. පාලක මණ්ඩල පත්වීම් පිලිබඳව දැනුම් දීම රේඛීය අමාත්‍යංශය මගින් සිදු කරනු ලබන අතර එහිදී යම් ප්‍රමාදයක් සිදු වී ඇත.

පාලක මණ්ඩල රැස්වීම් වලදී එක් එක් ව්‍යාපෘතියේ ප්‍රගතිය සමාලෝචනයට ලක් කරන අතර පාලක මණ්ඩල සාමාජිකයන්ගේ යෝජනාද සැලකිල්ලට ගනු ලැබේ.

(ආ) එකඟ වෙමි.

මේ සම්බන්ධයෙන් ප්‍රගති සමාලෝචනයේදී අධ්‍යක්ෂවරයා දැනුවත් කරන ලදී.

**(ඇ)** ආයතනික ව්‍යුහය වෙනස් කිරීමෙන් අනතුරුව පනතේ සංශෝධන කටයුතු සිදු කිරීමට කටයුතු සිදු කරනු ඇත.

(ඈ) එකඟ වෙමි.

ඉදිරියේදී පර්යේෂන සමාලෝචනය හා මග පෙන්වීම සඳහා කමිටුවක්(Steering Committee) පත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමි.

**4.3 ආර්ථික නොවන ගණුදෙනු**

විභාග දෙපාර්තමේන්තුවෙන් 2014 වර්ෂයේ අ.පො.ස (උ.පෙළ) විභාගයට පෙනී සිටි පෞද්ගලික අයැදුම්කරුවන්ගේ ලබාගත් නාම ලේඛනය අනුව ඔවුන්හට පෞද්ගලිකවම ලිපි තැපැල් කිරීමට අමතරව, බැනර්, පෝස්ටර්, මාධ්‍ය මගින් හා අදාල දිස්ත්‍රික්කයේ නිපුණතා සංවර්ධන නිළධාරීන් හා වෘත්තීය පුහුණු ආයතන හරහාද ප්‍රජාව දැනුවත් කරන ලදී. ඒ අනුව සිසුන්ගේ ගෙන්වා ගැනීම සඳහා හැකි සෑම උත්සාහයක්ම දරා ඇති අතර ලිපි මගින්, නිපුණතා නිළධාරීන් හා අනෙකුත් ක්‍රම මගින් සහභාගි වෙතැයි අපේක්ෂා කල ප්‍රමාණය අනුව නිවැරදිව මිණුම් කර මිලදී ගැනීම සිදු කරන ලදී. එසේම, ආහාර පාන විශාල ප්‍රමාණයක් එදිනම ලබාගත නොහැකි බැවින් කල්වේලා ඇතිව මිල ගණන් කැඳවා ඇනවුම් කරන ලදී. නමුත් එදින සහභාගි වන ප්‍රමාණය අපගේ පාලනයෙන් බැහැරව සිදුවන්නක් වන බැවින්ද ඇනවුම් කළ පසු එදින නැවත එම ප්‍රමාණය අඩු කළ නොහැකි කටයුත්තක් වන බැවින් ඒ සඳහා වැය වූ වියදම පාලනය කිරීමට නොහැකි වී

ඇත. කෙසේ වෙතත් ඉන් පසුව සැලසුම්කල වැඩසටහන් සඳහා මෙම වැඩසටහන් වල සහභාගීත්වය පූර්වාදර්ශයක් කර ගන්නා ලදී.

### 5.1 අභ්‍යන්තර විගණනය

අප ආයතනය තුල අභ්‍යන්තර විගණන අංශයක් නොමැති බැවින් අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය මඟින් විගණන කටයුතු සිදු කරවා ගැනීමට අමාත්‍යාංශයේ ප්‍රගති සමාලෝචන රැස්වීම් වලදී සාකච්ජා කලද ඉන් යහපත් ප්‍රතිචාරයක් නොලැබුණි. ඉදිරියේදී ආයතනයේ සිදු කිරීමට අපේක්ෂිත ව්‍යුහාත්මක වෙනස්කිරීම්වලින් අනතුරුව ආයතනයට සුදුසුකම් ඇති අභ්‍යන්තර විගණන කාර්ය මණ්ඩලයක් බඳවා ගැනීමට අපේක්ෂා කෙරේ.

### 5.2 අයවැය ලේඛනමය පාලනය

වර්ෂය තුළදී ආයතනයට ප්‍රතිපාදිත පුණරාවර්තන සීමාව මිලියන 21 ක් වන අතර එම ප්‍රතිපාදන සීමාව තුළ හිඳිමින් අයවැය ප්‍රකාරව 98.91% ක් දක්වා උපරිමයකට වියදම් දැරීමට ආයතනයට හැකියාව ලැබී ඇත. ප්‍රතිපාදිත මුදලින් භාණ්ඩාගාරයෙන් නිකුත් කරන ලද මුළු පුණරාවර්තන ප්‍රතිපාදනය 100% ක්ම වියදම් කිරීමට හැකි වී ඇති අතර ප්‍රතිපාදන සීමාව තුළ හිඳිමින් ඉතිරි වියදම් ආයතනයේ පැවති මුදල් ශේෂයෙන් වියදම් කිරීමට හැකි වී ඇත. රු. මිලියන 21 සඳහාම මුදල් ඉල්ලීමේ පත්‍රිකා භාණ්ඩාගාරය වෙත යොමු කර ඇත. ප්‍රතිපාදිත සීමාව ඉක්මවා නොමැති මොහොතක ලැබුණු පුණරාවර්තන මුදල් ප්‍රමාණය ඉක්මවා වියදම් දැරීමේ දෝෂයක් නොමැත.

## 6. පද්ධති පාලනයන්

ආ) එකඟ නොවේ.

පනතේ අරමුණු ඉටු කර ගැනීම සඳහා ක්‍රියාකාරී සැලැස්ම සකස් කර ඒ ඒ සියළු ව්‍යාපෘති වෙනුවෙන් මුදල් ප්‍රතිපාදනය සිදු කර ඇත. ඉන් ජාතික මානව සම්පත් සංවර්ධන ප්‍රත්පත්තිය සමාලෝචනය වෙනුවෙන් වර්ෂය මුලදී රු. මිලියන 1 ක ප්‍රතිපාදන වෙන් කලද මෙම ජාතික මානව සම්පත් ප්‍රතිපත්තිය සමාලෝචන කටයුතු කම්කරු අමාත්‍යාංශයට බාරදී මා ඇති බැවින් ඒ සඳහා තවදුරටත් පිරිවැයක් දැරීමට සිදු නොවීම හේතුවෙන් අදාල ප්‍රතිපාදන ක්‍රියාකාරී සැලැස්ම සංශෝධනයේදී වෙනත් ව්‍යාපෘති සඳහා මාරු කරන ලදී.

ඒ අනුව පනතේ අරමුණු ඉටු කර ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැතිය යන්නට එකඟ විය නොහැක.

ආ) ලිපි ද්‍රව්‍ය තොග පාලනය සඳහා නිසි ක්‍රමවේදයක් සකස් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත.

කේ.ඒ. ලලිතධීර<br>
අධ්‍යක්ෂ<br>
සභාපති වෙනුවට